උසස් පෙළ නව විෂය නිර්දේශය

ජීව විද්‍යාව

ප්‍රකාශනය සහ බෙදාහැරීම

PRO WORDS BOOK SHOP

No. 31/7, Minuwangoda Road, Gampaha.

පොත් ගෙන්වාගැනීම සඳහා විමසීම්

0712 897547

උසස් පෙළ නව විෂය නිර්දේශය

ජීව විද්‍යාව

1985-2019

BOOK 02

නව විෂය නිර්දේශයට අනුව
සංශෝධනය කළ සහ වර්ගීකරණය කළ

බහුවරණ

3 වන ඒකකය | පරිණාමය හා ජීවීන්ගේ විවිධත්වය.

3 ඒකකය ජීවීන්ගේ පරිණාමය ගවේෂණය

නිපුණතාව 3.1.0 : ජීවයේ පරිණාමය ගවේෂණය
නිපුණතා මට්ටම 3.1.1 : ජීවයේ සම්භවය සහ ස්වභාවික වරණ වාදය

(01) පහත ප්‍රකාශ වලින් අසත්‍ය වන්නේ,
1. මිහිමත ජීවය සම්භවය වී වසර බිලියන 1.5ක් පමණ කාලයක් ප්‍රාග් න්‍යෂ්ටිකයන් පමණක් වාසය කෙරුණි.
2. වායුගෝලීය O_2 සාන්ද්‍රණය ඉහළයාම මගින් හරිතලවයේ සම්භවය වීම වේගවත් විය.
3. වායුගෝලීය O_2 සාන්ද්‍රණය ඉහළ යාමේදී සියලුම නිර්වායුක ප්‍රාග්න්‍යෂ්ටිකයන් විනාශ වී ගියේය.
4. බොහෝ රූප විද්‍යාත්මක විවිධාංගීකරණයන් ජීවීන් තුළ පරිණාමය වීමට සංකීර්ණ ව්‍යුහයන් දරන සූ න්‍යෂ්ටික සෛල සංවිධානය බිහිවීම හේතුවිය.
5. ජීවීන්ගේ මුල්ම ජාන සහ එන්සයිම ලෙස RNA ක්‍රියා කර ඇත. (1989 - Z)

(02) පහත සඳහන් වගන්ති අතරින් පරිණාමය පිළිබඳ වැරදි වගන්තිය වන්නේ කුමක්ද?
1. පරිණාමය අඛණ්ඩ ක්‍රියාවලියකි
2. විවිධ විශේෂ විවිධ වේගයෙන් පරිණාමය වේ
3. පරිසරයේ වෙනස්වීමක් නොමැතිව ප්‍රවේණි ද්‍රව්‍ය වල ප්‍රභේදනයක් ඇතිවිය නොහැකිය
4. පරිණාමය වනුයේ ගහණයන් මිස පුද්ගලයන් නොවේ
5. පරිණාමය පිළිබඳ නූතන මතවල අඩුපාඩුකම් ඇත (1990 - Z)

(03) පහත සඳහන් අදහස් අතරින් ඩාවින්ගේ පරිණාමවාදයෙහි ඇතුලත් කොට නොමැති අදහස කුමක්ද?
1. අධි ජනනය
2. තරඟය
3. පරිසරය මගින් ස්වභාවික වරණය
4. උචිතෝන්නතිය
5. ජාන හරහා ප්‍රවේණි වීම (1990 - Z)

(04) ප්‍රවේණික ප්‍රභේදන විශාල වශයෙන් ඇති වන්නේ,
1. අංකුර වැඩීම මගිනි
2. ද්වි ඛණ්ඩනය මගිනි
3. බහු ඛණ්ඩනය මගිනි
4. කෞමාරෝද්භවය මගිනි
5. ලිංගික ප්‍රජනනය මගිනි (1990 - Z)

(05) පහත ප්‍රකාශ වලින් අසත්‍ය වන්නේ,
1. වසර බිලියන 4.6කට පෙර ජීවය බිහිවීමට සුදුසු පරිසරය මිහිමත ස්ථාපිත වී තිබුණි.
2. පෘථිවියේ ප්‍රථම වායුගෝලය තුළ N_2 හා කාබන් වල ඔක්සයිඩ අඩංගු විය.
3. ජලතාපක මංකඩ හා ක්ෂාරීය මංකඩ ආදිය පෘථිවිය මත ජීවය සම්භවය අවශ්‍ය ශක්තිය සපයන ලදී.
4. කාබනික අණු වලින් සමන්විත ද්‍රාවණයක් ලෙස පැවැති ආදි සාගරය ආදි සූපයක් ලෙස තිබී ඇතිබව හැල්ඩේන් විසින් යෝජනා කරන ලදී.
5. මිහිමත සම්භවය වූ මුල්ම ජීවීන් තුළ ස්වායු ශ්වසනයට අනුවර්තනය නොදැරීය. (1991 - B)

(06) පහත සඳහන් ඒවා අතරින් පරිණාමය සඳහා සම්පූර්ණයෙන්ම අත්‍යවශ්‍ය වන්නේ,
1. විකෘති ය
2. තරඟය ය
3. අධි ජනනය
4. පාරිසරික වෙනස්වීම්
5. අනුවර්තනය (1992 - Z)

(07) සෑම ගහනයකම පරිණාමය සඳහා තිබීම අවශ්‍ය වන්නේ,
1. ප්‍රමුඛ ලක්ෂණය
2. නිලීන ලක්ෂණය
3. ප්‍රවේණික ප්‍රභේදනය
4. සසම්භාවී සංවාසය
5. තරඟය චර්යාව (1992 - Z)

(08) චාල්ස් ඩාවින් "විශේෂ වල සම්භවයේ"ප්‍රකාශයට පත්කොට වසර 150ක් පමණ කාලයක් ගතවී ඇත.
1. එදා සිට මෙම වාදයට ප්‍රධාන වෙනස්කම් සිදුකොට ඇත.
2. එදා සිට බොහෝ ජීව විද්‍යාඥයින් මෙම වාදය ප්‍රතික්ෂේප කර ඇත
3. එදා සිට ජීව විද්‍යාවේ බොහෝ ක්ෂේත්‍රයන් තුල සිදුකර ඇති අධ්‍යයනයන් මෙම වාදය පරස්පර විරෝධී කරයි.
4. එදි සිට වාදයේ ප්‍රධානතම ආධාරකරු වන්නේ මෙන්ඩල් ය
5. වාදයෙහි නූතන අනුවාදයට දී ඇති නාමය නව - ඩාවින් වාදයයි (1993 - Z)

(09) ප්‍රාක් සෛලය පිළිබඳ පහත ප්‍රකාශ වලින් සත්‍ය වන්නේ,
a) ප්‍රාක් සෛය තුළ නයිට්‍රජනීය භෂ්මයක් ලෙස තයිමින් අඩංගු ය.
b) මිසෙල්ලා සංසට්ටනය වී පටලයට ලිපිඩ ඒකරාශී වී සෛල වර්ධනය සිදුවුණි.
c) අනූනන විභාජනය මගින් ප්‍රජනනය සිදුකර RNA අඩංගු ප්‍රාග් සෛල 2ක් බවට පත්විය.
d) ප්‍රතිවලිත වීමේ හැකියාව දරන RNA අණු අඩංගු විය.

1. a හා c පමණි
2. a හා b පමණි
3. b හා d පමණි
4. a, b හා d පමණි
5. ඉහත කිසිවක් නොවේ. (1993 - Z)

(10) ප්‍රවේණිකව නිර්ණය කරනු ලබන ලක්ෂණ වල ස්වභාවික වරණය නිසා සිදුවන ජෛව පරිණාමය පිළිබඳ වාදය හැඳින්වෙනුයේ,
1. ලැමාර්ක් වාදය ලෙසයි
2. ඩාවින් වාදය ලෙසයි
3. නව ඩාවින් වාදය ලෙසයි
4. වායිස්මාන්ගේ වාදය ලෙසයි
5. වොලස්ගේ වාදය ලෙසයි (1995 - Z)

(11) ඩාවින්ට තම පරිණාමවාදය ඉදිරිපත් කිරීම සඳහා පදනම් වූ නිරීක්ෂණය වූයේ,

1. ස්වභාවික වරණය   2. තරඟය ය   3. උච්චතෝන්නතිය ය
4. ජීවන සටන ය   5. අධිජනනය ය   (1996 - Z)

(12) පහත සඳහන් වගන්ති අතරින් සත්ත්ව පරිණාමය පිළිබඳව අසත්‍ය වන්නේ කුමක්ද?

1. එය අඛණ්ඩව සිදුවන ක්‍රියාවලියකි
2. එය ගහණයක් තුළ පමණක් සිදුවේ
3. එය සෙමෙන් සිදුවන ක්‍රියාවලියකි
4. එය ප්‍රවේණි සංයුතියේ වෙනස්වීමක් ලෙස අර්ථ දැක්වේ.
5. එය මිනිස් ක්‍රියාවන්ගේ ප්‍රතිඵලයක් නිසා සිදුවිය නොහැක   (1999 - Z)

(13) ලැමාක්ට අනුව,

1. අවයවයක් අඛණ්ඩව භාවිතා කිරීම එහි ප්‍රමාණය මත බලපෑමක් නොකරයි
2. සත්ත්වයින් අතර ජීවන සටනක් ඇත
3. විශේෂයක ඒකෙකයන් එකිනෙකාගෙන් ස්වල්ප ලෙස වෙනස් වේ
4. සත්ත්වයෙකු නිපදවනු ලබන ජනිතයින්ගේ සුහුඹුලන් බවට පත්වනුයේ ස්වල්ප දෙනෙක් පමණි
5. රූපානුදර්ශීය වෙන්වීම් ප්‍රජනිතයන්ට ප්‍රවේණිගත වේ   (1999 - Z)

(14) සූ න්‍යෂ්ටිකයන්ගේ බිහිවීම හා විවිධාංගීකරණය පිළිබඳ පහත වගන්ති අතුරින් සත්‍ය වනුයේ,

1. පැරණිතම සූන්‍යෂ්ටික බහු සෛලිකයන් මීට වසර බිලියන 1.8 කට පෙර සම්භවය විය.
2. පොරිෆෙරා, ස්පොන්ජීන් වැනි සත්ත්ව කාණ්ඩ බිහිවන්නේ පසු ප්‍රොටෙරොසොයික් වකවානුවේදී ය.
3. ආත්‍රොපෝඩා හා කෝඩේටා වංශ වල පූර්වජයන් මීට වසර මිලියන 365කට පමණ පෙර සම්භවය විය.
4. වර්තමානයේ මිහිමත වාසය කරන බොහෝ සත්ව වංශ සම්භවය වූයේ කේම්බ්‍රීය යුගයේ අග භාගයේ දී ය.
5. ප්‍රෝටිස්ටාවන්ට සමාන කුඩා රතු ඇල්ගී වසර බිලියන 1.4 කට පෙර සම්භවය විය.   (2001)

(15) ඩාවින්ට අනුව පැවැත්ම හා ප්‍රජනනයට වැදගත් වන වාසිසහගත ලක්ෂණයක් නොවන්නේ,

1. රෝග වලට ප්‍රතිරෝධතාව
2. පීඩාකාරී තත්ත්ව හමුවේ විනාශ වී යාමේ ප්‍රවණතාවය
3. සංසේචන සම්භාවිතාව ඉහළ වීම
4. විලෝපිකයාගෙන් බේරීමට ඇති හැකියාව
5. ආහාර ලබාගැනීමට ඇති ඉහළ හැකියාව   (2005)

(16) රසල් වොලස් පිළිබඳව පහත සඳහන් ප්‍රකාශ අතරින් කවරක් නිවැරදිද?

1. ඔහුගේ පරීක්ෂණ පරිචිත ලක්ෂණ ආවේණික වාදයට රුකුලක් විය.
2. ඔහුගේ පරීක්ෂණ ජීවයේ ස්වයංසිද්ධි ජනන වාදය නිශ්ප්‍රභා කළේය.
3. ඔහු අකාබනික ද්‍රව්‍ය වලින් කාබනික ද්‍රව්‍ය ඇතිවිය හැකි බව ඔප්පු කිරීම සඳහා පරීක්ෂණ පැවැත්වීය.
4. ඔහු ස්වභාවික වරණ වාදයට සහාය වන සාක්ෂි සොයා ගත්තේය.
5. ඔහු පෘථිවියට ජීවය පැමිණියේ අභ්‍යවකාශයෙන් යැයි විශ්වාස කළේය.   (2005)

(17) පහත දැක්වෙන සිද්ධීන් අතරින් කවරක් ස්වභාවික වරණයට නිදර්ශකයක් වේ ද?

1. වී ප්‍රභේද දෙකක් මුහුම් කොට වඩා හොඳ වී ප්‍රභේදයක් නිපදවීම.
2. කුඹුරකට වල්නාශක යෙදීම නිසා වී අස්වනු ප්‍රමාණය වැඩිවීම.
3. කුඹුරකට කෘමිනාශක යෙදීම නිසා කෘමිනාශක වලට ප්‍රතිරෝධී කෘමීන් වැඩිවීම.
4. කුඹුරකට කෘෂිරසායනික යෙදීම නිසා විවිධත්වය අඩුවීම.
5. දුඹුරු කීඩෑවන්ගේ සීඝ්‍ර ව්‍යාප්තිය නිසා වී අස්වනු ප්‍රමාණය අඩුවීම.   (2005)

(18) "ජීවියෙක් තම ජීවන කාලය තුළදී පරිසරයට අනුවර්තනය වීම් වශයෙන් වර්ධනය කර ගන්නා ලක්ෂණ තම ප්‍රජනිතයන්ට සම්ප්‍රේශනය කරයි." මෙම ප්‍රකාශය ගැන නිවැරදි වන්නේ පහත සඳහන් ඒවා අතුරින් කවරක්ද?

1. මෙය චාල්ස් ඩාවින් විශ්වාස කළ මතයයි.
2. මෙය ලැමාක් විසින් ඉදිරිපත් කරල ලද වාදයකි.
3. මෙය ස්වභාවික වරණ වාදයේ අත්‍යවශ්‍ය අංගයකි.
4. මෙය තෝමස් මැල්තස් විසින් ඉදිරිපත් කරන ලද වාදයකි.
5. මෙය උච්චතෝන්නතිය සඳහා අවශ්‍ය වේ.   (2007)

(19) පහත සඳහන් ඒවා අතරින් කවරක් ඩාවින් හෝ වොලස් ස්වභාවික ගහන ආශ්‍රිතව කළ නිරීක්ෂණයක් නොවේද?

1. ස්වභාවික ගහනවල අධික ප්‍රජනන විභවයක් ඇත.
2. ගහනවල ජාන සංඛ්‍යාතය ඉතා දීර්ඝ කාලයක් තුළ නොවෙනස්ව පවතී.
3. ගහනයක සාමාජිකයන් අතර විභේදන දැකිය හැකිය.
4. ගහනයක සාමාජිකයන් අතර දැඩි තරඟයක් ඇත.
5. ගහනයක සාමාජියන් අතුරෙන් බොහොමයක් ප්‍රජනනය නොකරයි.   (2009)

(20) ජීවීන්ගේ පරිණාමය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් කවරක් වැරදි ද?

1. පෘතුවියේ ප්‍රථමයෙන් පරිණාමය වූ ජීවීන් නිර්වායු ප්‍රාග් න්‍යෂ්ටිකයන් ය.
2. අධික ලෙස විශේෂනය වූ ජීවීන් නෂ්ට වීමේ අවදානමට ලක් වේ.
3. ඉතා වාසිදායක ලක්ෂණ වල පරිණාමය නව විශේෂ ඇතිවීමට හේතු වී ඇත.
4. මුහුදු ඇනිමනි හා බන්ධූන් කේම්බ්‍රීය යුගයේදී බිහි වූ සත්ත්ව කාණ්ඩ වේ.
5. වසර මිලියන 500කට පමණ පෙර ශාක, සතුන්, දිලීර භෞමික ගණාවාසිකරණය ඇරඹී ඇත.   (2010)

නිපුණතාව 3.2.0 : ජෛව විවිධත්වය ගවේෂණය
නිපුණතා මට්ටම 3.2.1 : විද්‍යාත්මක පදනමක් මත තක්සෝන ධූරාවලිය ගොඩ නගයි

(01) පෙනිසිලින් නිපදවන දිලීරයක විද්‍යානුකූල නාමය *Penicillium* (පෙන්සිලියම් නොටාටුම්) වේ. මෙහිදී *Penicillium* (පෙනිසිලියම්) යන්නෙන් නියෝජනය වන්නේ,
1. ප්‍රභේද නාමය 2. විශේෂ නාමය 3. ගණ නාමය
4. කුලයේ නාමය 5. ගෝත්‍රයේ නාමය (1987 - B)

(02) පහත සඳහන් අනුපිළිවෙලවල් නිවැරදි වන්නේ කුමක්ද?
1. Class, Order, Species, Phylum, Genus
2. Order, Genus, Species, Class, Phylum
3. Genus, Species, Phylum, Class, Order
4. Phylum, Class, Order, Genus, Species
5. Species, Genus, Class, Order, Phylum (1988 - Z)

(03) ජීවීන්ගේ ද්විපද නාමකරණය ප්‍රථමයෙන් යෝජනා කරන ලද්දේ,
1. අර්නස්ට් හේකල් (Ernest Haeckel) ය
2. රොබට් හුක් (Robert Hooke) ය
3. කැරොලස් ලිනෙයස් (Carl Linnaeus) ය
4. චාල්ස් ඩාවින් (Charles Darwin) ය
5. හෙන්රි ට්‍රයිමන් (Henry Trimen) ය (1988 - B)

(04) පහත දැක්වෙන ඒවායින් කවරක් වර්ගීකරණ ඒකකයක් නොවෙයිද?
1. ගණය 2. විශේෂය 3. ගෝත්‍රය 4. ක්ලෝනය 5. ප්‍රභේදය (1991 - B)

(05) ශාකයක සම්පූර්ණ විද්‍යාත්මක නමෙහි අඩංගු විය යුත්තේ,
1. ගණ නාමය, සුළු නාමය හා ප්‍රභේද නාමයයි
2. කුල නාමය, ගණ නාමය හා සුළු නාමයයි
3. ගණ නාමය හා සුළු නාමයයි
4. ගණ නාමය, සුළු නාමය සහ එම ශාකය මුලින්ම විස්තර කරන ලද තැනැත්තාගේ නාමයයි
5. ගණ නාමය හා ප්‍රභේද නාමයයි (1994 - B)

(06) ස්වභාවික හා කෘත්‍රිම වර්ගීකරණ පද්ධති එකිනෙකින් වෙන්කර හඳුනා ගැනීමට ස්වභාවික වර්ගීකරණ පද්ධතිය සතු ලක්ෂණය/ලක්ෂණ වන්නේ,
a) ලක්ෂණ සුළු සංඛ්‍යාවක් මත පදනම් වීම.
b) ජීවීන් කාණ්ඩ ඇතුලත් කරමින් පුළුල් කළ නොහැක.
c) පරිණාමය පිළිබඳ අධ්‍යයනයන්ගෙන් පසුව සකස් වී ඇත.
d) 18 වන ශත වර්ෂයට පෙර සිටම භාවිතා කරන ඇත.
1. a හා d පමණි 2. b හා c පමණි 3. a හා c පමණි
4. b හා d පමණි 5. ඉහත කිසිවක් නොවේ. (1994 - B)

(07) එකිනෙකට වඩාත් දුරස් පරිණාමික බන්ධුතා දක්වන අධිරාජධානි යුගලය/යුගල වන්නේ,
a) ආකියා හා බැක්ටීරියා
b) බැක්ටීරියා හා ඉයුකැරියා
c) ආකියා හා ඉයුකැරියා
1. a පමණි 2. b පමණි 3. c පමණි 4. a හා b පමණි
5. a හා c පමණි (1997 - Z)

(08) නූතන වර්ගීකරණ පද්ධති වල වැදගත් වර්ගීකරණ නිර්ණායක වන්නේ,
(A) හරිතලව වල DNA හි නයිට්‍රජනීය භෂ්ම අනුපිළිවෙල
(B) r-RNA හි භෂ්ම අනුපිළිවෙල
(C) සුලභ ප්‍රෝටීන වල ඇමයිනෝ අම්ල අනුපිළිවෙල
(D) සෛලීය සංඝටක වල අණුක ව්‍යුහය
(E) සියලුම ජානවල DNA හි භෂ්ම අනුපිළිවෙල (1998 - B)

(09) පහත සඳහන් ඒවා අතරින් වර්ගීකරණයේ ස්වභාවික ඒකකය වනුයේ කුමක්ද?
1. වංශය / කොට්ඨාශය 2. වර්ගය 3. ගෝත්‍රය
4. කුලය 5. විශේෂය (2000)

(10) ද්විපද නාමකරණයට අනුව මිනිසාගේ විද්‍යාත්මක නාමය නිවැරදිව නිරූපණය කරනු ලබන්නේ පහත සඳහන් ඒවා අතුරින් කුමක්ද?
1. *Homo Sepians* 2. *Homo sapiens sapians*
3. Homo sepians 4. *Homo sepians*
5. *Homo sepians* (2000)

(11) රාජධානි 5 ට ජීවීන් වර්ගීකරණය කිරීමේ දී භාවිතා කරනු ලබන ප්‍රධාන උපමානය / උපමාන වන්නේ පහත සඳහන් ඒවායින් කුමක්ද? / කුමන ඒවාද?
(A) පෝෂණ ආකාරය (B) ප්‍රජනන ආකාරය
(C) සෛලීය සංවිධානය (D) සත්‍ය පටකවලට විභේදනය වීම
(E) පරිණාමික අභිනති (2004)

(12) පහත සඳහන් කවර ලක්ෂණයක්/ලක්ෂණ ප්‍රාග්න්‍යෂ්ටිකයින් තුළ පමණක් දැකිය හැකිද?
(A) නිර්වායු ශ්වසනය
(B) සෛල බිත්තියේ ශාඛනය වූ හයිඩ්‍රොකාබන තිබීම
(C) සෛල ප්ලාස්මයේ වෘත්තාකාර DNA දැරීම
(D) වායුගෝලීය නයිට්‍රජන් තිර කිරීමේ හැකියාව
(E) ද්විඛණ්ඩනයෙන් ප්‍රජනනය කිරීම (2008)

(13) ජීවීන්ගේ රාජධානි 5 හා ජීවීන් එම රාජධානි වලට කාණ්ඩ කිරීමට භාවිතා වන ලක්ෂණ පහත දැක්වේ. එම සංයෝජන අතුරෙන් කවරක් වැරදි ද?

රාජධානිය	ලක්ෂණ
1. මොනෙරා	ඒකසෛලීය හෝ බහුසෛලීය, ප්‍රාග්න්‍යෂ්ටික, සෛල පටක වලට විභේදනය වී නැත
2. දිලීර	ඒකසෛලීය හෝ බහුසෛලීය, සූන්‍යෂ්ටික, සෙසල පටක වලට විභේදනය වී නැත
3. ප්‍රොටිස්ටා	ඒකසෛලීය හෝ බහුසෛලීය, සූන්‍යෂ්ටික
4. ශාක	බහුසෛලීය, සූන්‍යෂ්ටික, සෛල පටක වලට විභේදනය වී ඇත
5. සත්ත්ව	ඒකසෛලීය හෝ බහුසෛලීය, සූන්‍යෂ්ටික, බහුසෛලීය වන විට සෛල පටක වලට විභේදනය වී ඇත

(2009)

(14) පහත සඳහන් තක්සෝන අතුරින් පොදු ලක්ෂණ වැඩි ම සංඛ්‍යාවක් ඇත්තේ කුමන තක්සොනයේද?

1. වංශය 2. වර්ගය 3. ගණය 4. කුලය 5. ගෝත්‍රය

(2010)

(15) ආකියා හා යුකැරියා අධිරාජධානි වලට පොදු වනුයේ පහත සඳහන් ලක්ෂණ අතුරින් කුමක්ද/ කුමන ඒවාද?

(A) RNA පොලිමරේස් වර්ග කීපයක් තිබීම
(B) ප්‍රතිජීවක වලට සංවේදී නොවීම
(C) සෛල පටලයේ ශාඛනය වූ ලිපිඩ අණු තිබීම
(D) සෛල බිත්තියේ පෙප්ටිඩොග්ලයිකෑන් නොතිබීම
(E) සූන්‍යෂ්ටික සෛල සංවිධානය (2011)

(16) ආකියා රාජධානියේ සාමාජිකයෝ,

1. පෙප්ටිඩොග්ලයිකෑන් රහිත සෛල බිත්ති දරති.
2. $100^{0}C$ වඩා වැඩි උෂ්ණත්ව වර්ධනයක් නොපෙන්වයි.
3. එක් වර්ගයකට අයත් RNA පොලිමරේස් පමණක් දරති.
4. බොහෝ ප්‍රතිජීවක වලට සංවේදී වෙති.
5. ශාඛනය නොවූ ලිපිඩ අඩංගු සෛල පටල දරයි.

(17) ජීවීන් වර්ගීකරණයේ දී වංශය නැමැති තක්සෝනය හඳුන්වා දුන්නේ,

1. කාර්ල් වූස් ය 2. රොබට් විටෙකර් ය 3. අර්නස්ට් හේකල් ය
4. කැරොලිස් ලිනේයස් ය 5. ඇරිස්ටෝටල් ය (2013)

(18) සෛල පටලයේ ශාඛනය වූ ලිපිඩ අඩංගු ගණයක් අන්තර්ගත වන්නේ පහත සඳහන් කුමන කාණ්ඩයේද?

1. *Lyngbya, Halobacteria, Cycas* සහ *Agaricus*
2. *Clostridum, Streptomyces, Fasciola* සහ *Chloroxylon*
3. *Melursus, Staphylococcus, Allomyces* සහ *Garcinia*
4. *Rhizopus, Hevea, Salmonella* සහ *Gelidium*
5. *Macrognathus, Mucor, Thiobacillus* සහ *Caryota* (2017)

(19) ජීවීන්ගේ වර්ගීකරණය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ කුමක්ද?

1. හොඳින් සංවිධානය වූ න්‍යෂ්ටියක් නොදරන බැවින් වයිරස කිසිම රාජධානියකට අයත් නොවේ.
2. ප්‍රොටිස්ටා යනු විවිධ පරිණාමික සම්භවයන් සහිත ජීවීන් අන්තර්ගත ස්වභාවික රාජධානියකි.
3. ගණයක් තුළ දැකිය හැකි පොදු ලක්ෂණ සංඛ්‍යාව, විශේෂයක් තුළ දැකිය හැකි පොදු ලක්ෂණ සංඛ්‍යාවට වඩා වැඩි ය.
4. ශාක රාජධානිය මුලින් ම හඳුනාගත්තේ කැරොලස් ලිනේයස් ය.
5. අධිරාජධානි තුනේ වර්ගීකරණය හඳුන්වා දුන්නේ රොබට් විටේකර් ය. (2017)

වෛරස

(20) වයිරස පිළිබඳව නිවැරදි ප්‍රකාශයක් වන්නේ පහත සඳහන් කවරක්ද?,

1. වයිරස සියල්ලම පරපෝෂිත වේ.
2. වයිරස පරවතිය හැක්කේ සජීවී සෛල තුල පමණි
3. සෑම වයිරසයකම RNA ඇත.
4. වයිරස නිර්වායු ශ්වසනය සිදු කරයි.
5. වයිරස වල බාහිර ස්තරය සෑදී ඇත්තේ පොලිසැකරයිඩ වලිනි. (1986 - B)

(21) වෛරස වල සාපේක්ෂව සරල ව්‍යුහයක් ඇතත් ඔවුන් පෘථිවිය මත පරිණාමය වූ ප්‍රථම ජීවීන් ලෙස සැලකිය නොහැක්කේ,

1. වෛරස වල රයිබොනියුක්ලෙයික් අම්ල මදයක් ඇති නිසාය
2. වෛරස ප්‍රෝටීන වලින් සෑදී ආවරණයකින් සමන්විත නිසාය.
3. වෛරස ඉතා මෑතකදී සොයාගත් නිසාය.
4. වෛරස වලට ජීවී සෛල වලින් පිට ගුණනය වීමේ හැකියාව නොමැති නිසාය.
5. වෛරස අනෙක් ජීවීන් හට රෝග ඇති කරන නිසාය. (1987 - B)

(22) වෛරස පිළිබඳ නිවැරදි ප්‍රකාශ / ප්‍රකාශය තෝරන්න.

(A) වෛරස එක ධාරකයෙකුගෙන් තවත් ධාරකයෙකුට සම්ප්‍රේෂණය කළ හැකිය
(B) ශ්වසනයේදී වෛරස ශක්තිය නිපදවයි.
(C) පරීක්ෂණාගාරයේ සජීවී රෝපන වල වෛරස ගුණනය කළ හැකිය.
(D) වෛරස ස්ඵටිකරණය කළ හැකිය.
(E) වෛරස සචල වේ (1987 - B)

(23)වයිරස වල ප්‍රවේණි තොරතුරු සම්ප්‍රේෂණය වන්නේ පහත සඳහන් කවර ද්‍රව්‍ය මගින්ද?

1. කබෝහයිඩ්රේට 2. ප්‍රෝටීන 3. ලිපිඩ
4. න්‍යෂ්ටික අම්ල 5. ඇමයිනෝ අම්ල (1989 - B)

(24) වෛරස, අනෙකුත් ජීවීන්ගෙන් වෙනස් වන්නේ වෛරස වල,
1. ප්‍රෝටීන් නැති නිසාය
2. න්‍යෂ්ටික අම්ල නැති නිසාය
3. සෛලීය සංවිධානයක් නැති නිසාය
4. ප්‍රවේණි ද්‍රව්‍ය නැති නිසාය
5. ප්‍රජනක යාන්ත්‍රණයක් නැති නිසාය (1990 - B)

(25) වෛරස, බැක්ටීරියා වලින් වෙනස් වන්නේ ඒවා,
1. ශාක වලට හා සත්ත්වයන්ට රෝග ඇති කරන නිසාය
2. ප්‍රෝටීන හා න්‍යෂ්ටික අම්ල දරන නිසාය.
3. ජීව සෛල තුල පමණක් බහුගුණනය වන නිසාය
4. පරිවෘත්තිය යාන්ත්‍රණ නොදරන නිසාය
5. පෘෂ්ඨවංශිකයන් තුළ ප්‍රතිදේහ නිෂ්පාදනය නොකරන නිසාය (1993 - B)

(26) වයිරස වල පහත දැක්වෙන ලක්ෂණ අතරින් කවර ලක්ෂණයක් ඒවා පෘථිවියේ ප්‍රථමයෙන් පරිණාමය වූ ජීවීන් විය නොහැකි යයි පෙන්නුම් කරන්නේද?
1. වයිරස වල න්‍යෂ්ටික අම්ල හා ප්‍රෝටීන අඩංගු වීම
2. වයිරස වල සෛලීය සමංගිකරණයන් නොදැක්වීම
3. වයිරස වල බහුගුණනය විය හැක්කේ ජීවී සෛල තුල පමණක් වීම
4. වයිරස වල සාපේක්ෂ වශයෙන් සරල ව්‍යුහයක් දැරීම.
5. වයිරස ස්ඵටිකීකරණය කළ හැකිවීම. (1994 - B)

(27) වෛරස පිළිබඳව පහත දැක්වෙන ඒවා අතරින් කවරක් වැරදිද?
1. ඒවා ආලෝක අන්වීක්ෂයෙන් දැකිය නොහැකිය.
2. ඒවායේ න්‍යෂ්ටික අම්ලය DNA, RNA හෝ වේ.
3. ඒවාට විකෘති විය හැකිය.
4. ඒවා ප්‍රාග්න්‍යෂ්ටික ජීවීන්ය.
5. ඒවාට ප්‍රෝටීන වලින් සැදි ආවරණය ඇත. (1995- B)

(28) වෛරස පිළිබඳ පහත දැක්වෙන ප්‍රකාශ අතරින් කවරක් වැරදි ද?
1. ඒවා හි ප්‍රවේණි ද්‍රව්‍යය RNA හෝ DNA විය හැකිය.
2. ඒවා හි නියුක්ලෙයික් අම්ල ප්‍රෝටීන කොපුවකින් ආවරණය වී ඇත.
3. ඒවා ගුණනය විය හැක්කේ සජීවී සෛල තුළ පමණි.
4. පහත් උෂ්ණත්ව වලදී ඒවා හි ආසාදන හැකියාව නැති වේ.
5. ඇතැම් වෛරස කැස්සේදී කෙළ බිංදු මගින් සම්ප්‍රේෂණය වේ. (1999- B)

නිපුණතාව 3.2.2 : බැක්ටීරියා සහ සයනොබැක්ටීරියා

- 1 සිට 3 තෙක් ප්‍රශ්න පදනම් වී ඇත්තේ පහත සඳහන් ජීවීන් (A - E) පස් දෙනා මතය.

(A) *Rhizobium* (රයිසෝබියම්)
(B) *Aspergillus*
(C) *Anabaena/Nostoc* (ඇනබිනා / නොස්ටොක්)
(D) *Ulva*
(E) *Clostridium* (ක්ලොස්ට්‍රඩියම්)

(01) ඉහත සඳහන් ජීවීන් අතුරින් හෙටරොසිස්ට සහිත වන්නේ කවර ජීවියා / ජීවීන්ද?

(02) ඉහත සඳහන් ජීවීන් අතුරින් සංවිධානය වූ න්‍යෂ්ටි සහිත වන්නේ කවර ජීවියා / ජීවියාද?

(03) ඉහත සඳහන් ජීවීන් අතුරින් ස්වයංපෝෂිත වන්නේ කවර ජීවියා/ජීවීන්ද? (1986 - B)

(04) සත්‍ය ප්‍රකාශය / ප්‍රාකාශ තෝරන්න.
(A) සමහර බැක්ටීරියාවල සෛල බිත්තියට පිටතින් ප්‍රෝටීන ප්‍රාවරයක් ඇත.
(B) ක්ෂය රෝගය ඇති කරනුයේ වෛරසයක් මගිනි.
(C) වර්ණ ගැන්වීමෙන් අනතුරුව ආලෝක අන්වීක්ෂයකින් බැක්ටීරියා වල කශිකා නිරීක්ෂණය කළ හැකිය.
(D) සමහර කෑම වර්ග නරක්වීම වැළැක්වීම සඳහා දිය ලුණු එකතු කරනු ලැබේ.
(E) ටින්වල ඇසුරු මාළුවල බොහෝ විට ජීව්‍ය බැක්ටීරියා සෛල තිබේ. (1987 - B)

(05) වැරදි ප්‍රකාශය තෝරන්න.
1. ස්වභාවික වර්ගීකරණ පද්ධතියක් පදනම් වී ඇත්තේ පරිණාමික බන්ධුතා මතය.
2. විභාජක සෛලවල වැඩි ප්‍රෝටීන් සංශ්ලේෂණ වේගයක් ඇත.
3. ඇතැම් බැක්ටීරියා බීජාණු වලට නටන ජලයේ උෂ්ණත්වයට ඔරොත්තු දිය හැකිය.
4. ඇතැම් වෛරසවලට සජීවී සෛල වලින් පිටත ජීවන චක්‍රය සම්පූර්ණ කළ හැකිය.
5. ඇතැම් ආවෘත බීජක (ඇන්ජියෝස්පර්මේ) ශාක ත්‍රි අංකි පුෂ්ප දරයි. (1990 - B)

(06) නිලහරිතයන් සත්‍ය බැක්ටීරියා වලට සමාන වන්නේ ඒ දෙකොටසම,
1. පයිකොසයනින් වර්ණක දරන බැවිනි
2. විෂමපෝෂක බැවිනි
3. ප්‍රාග්න්‍යෂ්ටික බැවිනි
4. කයිටින් වලින් සැදුන සෛල බිත්ති සහිත වන බැවිනි
5. කශිකා මගින් චලනය දක්වන බැවිනි (1990 - B)

(07) බැක්ටීරියා වර්ණදේහයේ අඩංගු වන්නේ,
1. RNA පමණි
2. DNA පමණි
3. RNA හා DNA පමණි
4. DNA හා ප්‍රෝටීන පමණි
5. RNA හා DNA හාප්‍රෝටීන පමණි. (1991 - B)

(08) රසායනික සංස්ලේෂක බැක්ටීරියා පසෙහි සරුබව වැඩිකරන්නේ,

1. ඇමෝනිකරණය මගින් ය
2. නයිට්‍රිහරණය මගින් ය
3. නයිට්‍රජන් තිර කිරීම මගින් ය
4. නයිට්‍රිකරණය මගින් ය
5. ප්‍රෝටීන් ජීර්ණය මගින් ය

(1992 - B)

(09) *Clostridium tetani* සම්බන්ධයෙන් පහත සඳහන් ඒවා අතරින් කවරක් වැරදිද?

1. එය වෛකල්පිත නිර්වායු බැක්ටීරියාවකි.
2. එය මෘතෝප ජීවියෙකි.
3. එය බහිර්විෂ නිපදවන ජීවියෙකි
4. එය බීජාණු නිපදවන ජීවියෙකි.
5. එය පසෙහි සුලබය.

(1994 - B)

(10) ඇතැම් බැක්ටීරියා වලට උණුදිය උල්පත් ජලයේ පරිවෘත්තීය ක්‍රියා සිදුකළ හැක්කේ,

1. ඒවාට අවට පරිසරයේ ජලයේ උෂ්ණත්වයට වඩා බෙහෙවින් අඩු අභ්‍යන්තර උෂ්ණත්වයක් පවත්වා ගත හැකි බැවිනි.
2. වැඩි උෂ්ණත්වය පරිවෘත්තීය ක්‍රියා පහසු කරන නිසාය.
3. ඒවායේ එන්සයිම වැඩි උෂ්ණත්ව වලදීත් ක්‍රියාකාරී වන නිසාය.
4. ඒවායේ එන්සයිම උෂ්ණත්වයට සංවේදී නොවන නිසාය.
5. ඒවායේ ප්‍රධාන උත්ප්‍රේරකයන් ප්‍රෝටීන් නොවන අණු වලින් සෑදී ඇති නිසාය.

(1994 - B)

(11) සියලු ම බැක්ටීරියා වල දැකිය නොහැක්කේ පහත සඳහන් ඒවා අතරින් කවරක්/කවර ඒවාද?

(A) ප්‍රාවරය (B) රයිබසෝම (C) කශිකා
(D) මීසොසෝම (E) සෛල පටල

(1996 - B)

(12) පහත දැක්වෙන ප්‍රකාශ අතරින් කවරක් වැරදි ද?

1. වෛරස සියල්ල අනිවාර්ය පරපෝෂිත වේ.
2. ආවෘතබීජක සියල්ල ස්වයංපෝෂී වේ.
3. බැක්ටීරියා සියල්ල විෂමපෝෂී නොවේ.
4. දිලීර සියල්ල විෂමපෝෂී වේ.
5. බැක්ටීරියා සියල්ල ප්‍රාග්න්‍යෂ්ටික වේ.

(1996 - B)

(13) මයිටොකොන්ඩ්‍රියා සහ අන්තඃප්ලාස්මීය ජාලිකාවක් නොමැති ස්වයංපෝෂී ජීවීන් අඩංගු වන්නේ පහත සඳහන් කුමන ලැයිස්තුවේද?

1. *Anabaena, Nitrosomonas,* හරිත සල්ෆර් බැක්ටීරියා
2. *Oscillatoria, Vibrio, Nitrosomonas*
3. හරිත සල්ෆර් බැක්ටීරියා, *Vibrio, Nitrosomonas*
4. දුම්කොළ විචිත්‍ර වයිරස, *Anabaena, Nitrosomonas,* හරිත සල්ෆර් බැක්ටීරියා
5. *Anabaena, Oscillatoria, Vibrio*

(1998 - B)

(14) බැක්ටීරියා හා ආකියා අධිරාජධානි අතර පවතින සමානතාවයක් වන්නේ,

1. Chloramphenicol හමුවේ වර්ධනය නිශේධනය වීම
2. චක්‍රීය DNA සමඟ බැඳුණු හිස්ටෝන ප්‍රෝටීන තිබීම.
2. $100^{0}C$ ට ඉහළ උෂ්ණත්ව වලදී වර්ධනය නොවන ජීවීන් සිටීම
4. ශාඛනය නොවූ හයිඩ්‍රොකාබන් දාම පමණක් දැරීම.
5. RNA පොලිමරේස් ආකාර කීපයක් දැරීම.

(1998 - B)

(15) බැක්ටීරියා අධිරාජධානියට අයත් ලක්ෂණ වනුයේ,

(A) දේහ තරම 0.05μm සිට 0.5 μm දක්වා ජීවීන් සිටීම
(B) සියලුම බැක්ටීරියාවන් කශිකා දැරීම
(C) පොලිසැකරයිඩ ස්තරයකින් හෝ ප්‍රෝටීන ප්‍රාවරයකින් බිත්තිය ආවරණය වී ඇත
(D) අලිංගිකව ප්‍රජනනය කරයි.
(E) ඇතැමුන් බහුසෛලික වේ.

(1998 - B)

(16) සයොනොබැක්ටීරියා පිළිබඳ ව පහත සඳහන් ප්‍රකාශ අතරින් කවරක් වැරදි ද?

1. ඒවා කශිකා සහිත සෛල නිපදවන්නේ නැත.
2. ඒවා ජල දූෂණය පිළිබඳ දර්ශක ලෙස ප්‍රයෝජනවත් වේ.
3. ඒවා හි ප්‍රධාන ප්‍රභාසංස්ලේෂක වර්ණකය ක්ලෝරොපිල්' වේ.
4. ඒවා හි සෛල බිත්ති වල පෙප්ටිඩෝග්ලයිකෑන් ඇත.
5. ඒවා හෙටරොසිස්ට මගින් අලිංගික ව ප්‍රජනනය කරයි.

(1999 - B)

(17) අකාබනික කාබන් ප්‍රභවයකින් කාබන් ලබා ගන්නේ පහත සඳහන් ජීවීන් අතරින් කවරෙක්ද?

1. *Azotobacter*
2. *Nitrosomonas*
3. *Pseudomonas*
4. *Streptococcus*
5. *Clostridium*

(1999 - B)

(18) පහත දැක්වෙන ප්‍රකාශ අතරින් බැක්ටීරියා ප්ලාස්මිඩයක් පිළිබඳ ව වැරදි වන්නේ කුමක්ද?

1. එය චක්‍රීය DNA අණුවකි.
2. සෛල විභාජනයේදී එය ප්‍රතිවලිත වී දුහිතෘ සෛල සමඟ ගමන් කරයි.
3. එහි ඇත්තේ ජාන සුළු සංඛ්‍යාවක් පමණි.
4. එය ප්‍රයෝජනවත් කාර්යයන් ඉටු කරයි.
5. සෛලයේ පැවැත්ම සඳහා එය අත්‍යවශ්‍ය ය.

(2004)

(19) සයනොබැක්ටීරියා පිළිබඳ පහත දැක්වෙන ප්‍රකාශ අතරින් කවරක් නිවැරදි ද?

1. ඒවා සියල්ල කශිකා මගින් සංචරණය කරයි.
2. ඒවා සියල්ල මිරිදියෙහි දැකිය හැකිය.
3. ඒවා සියල්ල සණාවාස සාදයි.
4. ඒවා සියල්ල වායුගෝලීය නයිට්‍රජන් තිර කරයි.
5. ඒවා සියල්ල ප්‍රභාසංස්ලේෂකයෝ වේ.

(2008)

(20) වෛරස බැක්ටීරියා වලින් වෙනස් වන්නේ,
1. වෛරස ශාකවලට සහ සතුන්ට රෝග ඇති කරන නිසාය.
2. වෛරසවල RNA හා DNA ඇති නිසාය.
3. වෛරස සෛලීය සංවිධානයක් නොපෙන්වන නිසාය.
4. වෛරස විද්‍යාගාරයේ රෝපණය කළ නොහැකි නිසාය
5. වෛරස ස්වභාවිකව පුළුල්ව ව්‍යාප්ත වී ඇති නිසාය. (2013)

නිපුණතාව 3.2.3 : ප්‍රොටිස්ටා රාජධානිය

(01) නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. ප්‍රෝටීන් සංස්ලේෂණයේදී DNA වලින් කිසිදු කාර්යභාරයක් ඉටු නොවේ.
2. සූන්‍යෂ්ටික සෛල වල ප්‍රවේණි තොරතුරු සාමාන්‍යයෙන් වර්ණදේහික RNA වල පවතී.
3. බොහෝ පරිවෘත්තීය ප්‍රතික්‍රියා සඳහා අවශ්‍ය ශක්තිය සැපයෙන්නේ ATP අණු මගිනි.
4. ඇස්කොමයිසිටීස් දිලීර වල සහ හරිත ඇල්ගි වල සෛල බිත්ති රසායනිකව එක සමානය.
5. සෑම ස්වයංපෝෂී ජීවියෙකු තුළම ක්ලෝරොෆිල් a අඩංගු වේ. (1986 - B)

(02) හරිත ඇල්ගේ සහ රතු ඇල්ගේ සංසන්දනය කරන පහත සඳහන් ප්‍රකාශ අතරින් වැරදි ප්‍රකාශය තෝරන්න.
1. ක්ලෝරොෆිල් b හරිත ඇල්ගේවල ඇතත් රතු ඇල්ගේ වල නොමැත.
2. ක්ලෝරොෆිල් a හරිත ඇල්ගේ වල මෙන්ම රතු ඇල්ගේ වල ද ඇත.
3. හරිත ඇල්ගී සෛල බිත්ති නොදරන නමුත් රතු ඇල්ගී සෛල බිත්ති දරයි.
4. හරිත ඇල්ගී මෙන්ම රතු ඇල්ගී ද බහු සෛලික තලස දරයි.
5. රතු ඇල්ගී හා හරිත ඇල්ගී වල සංචිත ආහාර පිළිවෙලින් ෆ්ලොරිඩියන් පිෂ්ටය හා පිෂ්ටය ලෙස ගත හැක. (1986 - B)

(03) එගාර් ලබාගන්නේ ඇතැම්,
1. මිරිදිය ඇල්ගේ වලිනි
2. කරදිය ඇල්ගේ වලිනි
3. ලයිකන වලිනි
4. දිලීර වලිනි
5. නීලහරිත ඇල්ගේ වලිනි. (1986 - B)

(04) ඒක සෛලික හා කරදිය පරිසර වල හමුවන ජීවීන් වැඩිම ප්‍රමාණයක් අඩංගු පිළිතුර වන්නේ,
1. *Euglena, Amoeba,* Diatoms
2. *Euglena, Paramecium,* Diatoms
3. *Amoeba,* Diatoms, *Paramecium*
4. *Amoeba,* Diatoms
5. *Euglena, Amoeba* (1990 - B)

(05) ප්‍රෝටිස්ටාවන් පිළිබඳ අසත්‍ය ප්‍රකාශය වන්නේ,
1. ලැමිනරින් හා මැනිටෝල් *Gelidium* හි සංචිත ආහාර වේ.
2. ක්‍රිසොලැමිනරින් Diatoms හි සංචිත ආහාර වේ.
3. ක්ලෝරෆිල් a හා c *Sargassum* හි ප්‍රභාසංස්ලේෂක වර්ණක වේ
4. ෆයිකොසයනින් *Gelidium* හි ප්‍රභාසංස්ලේෂක වර්ණක වේ (1990 - B)
5. *Euglena* ආහාර රික්තක නොදරයි.

(06) වැරදි ප්‍රකාශය / ප්‍රකාශ තෝරන්න.
(A) සියලුම ශාක අතරින් බහුතරයක් ප්‍රභාසංස්ලේෂක වේ.
(B) සියලුම ඇල්ගේ ස්වයංපෝෂී වේ
(C) සියලුම ඇල්ගාවන් බහුසෛලික වේ.
(D) සියලුම ස්වයංපෝෂීන් ප්‍රභාසංස්ලේෂකයින් ය.
(E) සියලුම දිලීර මෘතෝප ජීවීන්ය (1991 - B)

(07) ඇල්ගී ගැන පහත සඳහන් ප්‍රකාශ අතරින් කවරක්/කවර ඒවා නිවැරදි වේද?
(A) ඒක සෛලික හෝ බහුසෛලික වේ.
(B) බොහෝමයක් ඇල්ගී ජල ස්ථර වල වැඩේ.
(C) ඒවායේ ලිංගික ව්‍යුහයන් වඳ සෛල ස්ථරයකින් ආවරණය වී ඇත.
(D) ඇල්ගී ජල පරිසර පද්ධතිවල වැදගත් ප්‍රාථමික නිෂ්පාදකයෝ වෙති.
(E) ඇල්ගී බොහෝමයක්ම ප්‍රාග්න්‍යෂ්ටික වේ. (1991 - B)

(08) ඇල්ගී පිළිබඳ සත්‍ය වන්නේ,
1. සියල්ලෝම ක්ලෝරෆිල් a දරයි
2. සියල්ලන්ගේම සෛල බිත්තියේ සෙලියුලෝස් ප්‍රධාන සංඝටකය වේ.
3. දුඹුරු ඇල්ගී වල සංචිත ආහාරය ඇල්ජිනික් අම්ලය වේ.
4. ඩයටම රන්වන් දුඹුරු පැහැ වන අතර කරදිය පමණක් වාසය කරයි.
5. හරිත ඇල්ගී මහේක්ෂීය වන අතර සෛල බිත්ති නොදරයි. (1992 - B)

(09) පහත දැක්වෙන ජීවීන් අතුරින් කුමක්/කුමන ඒවා අකාබනික ප්‍රභවයන්ගෙන් කාබන් අවශ්‍යතා සපයා ගන්නේද?
(A) *Nitrosomonas* (B) *Anabaena* (C) *Chlamydomonas*
(D) Clostridium (E) Pseudomonas (1993 - B)

(10) හරිත ඇල්ගී පිළිබඳව පහත සඳහන් ඒවා අතරින් කුමක් නිවැරදි ද?
(A) ඒවා කඳ, පත්‍ර හා මුල් වශයෙන් විභේදනයක් නොපෙන්වති.
(B) ඒවා බොහෝමයක් ජලජ හෝ තෙත් වාසස්ථාන වලට සීමා වේ.
(C) ඒවායේ ලිංගික ව්‍යුහයන් වඳ සෛල ස්ථරයකින් ආවරණය වී ඇත.
(D) ඇතැම් හරිත ඇල්ගී වලට වායුගෝලීය නයිට්‍රජන් තිර කළ හැක.
(E) ඒවා සියල්ලම ස්වයංපෝෂී වේ. (1993 - B)

(11) ප්‍රොටිස්ටාවන් පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතරින් කවරක්/කවර ඒවා නිවැරදි ද?
(A) ඔවුන් සමහරක් ඒක සෛලික ය.
(B) ඔවුන්ගෙන් සමහරක් ප්‍රාග්න්‍යෂ්ටික ය.
(C) ඔවුහු ජලජ සහ භෞමික වාසස්ථාන වල ජීවත් වෙති.
(D) ඔවුන්ගේ සෛල බිත්ති සෙලියුලෝස් වලින් සැමවිටම සෑදී ඇත.
(E) ඔවුන් සියල්ලන්ම ප්‍රභාසංස්ලේෂක වේ. (2008)

(12) කශිකා නොදරන ඒකසෛලීය ප්‍රොටිස්ටාවෙකු,
1. පෙනිසිලින් වලට සංවේදී විය හැකිය
2. පියුකොසැන්තින් දැරිය හැකිය.
3. විෂමපෝෂී විය හැකිය.
4. රතු ඇල්ගී ට අයත් විය හැකිය.
5. ෆයිකොසයනින් දැරිය හැකිය. (2018)

නිපුණතාව 3.2.4 : ශාක රාජධානියේ ජීවීන්ගේ විවිධත්වය

- 01 සිට 03 දක්වා ප්‍රශ්න පහත දී ඇති ජීවී ගණ මත පදනම් වේ.

(A) *Clostridium* (ක්ලොස්ට්‍රිඩියම්) (B) *Loranthus* (ලොරැන්තස්)
(C) *Ulva* (උල්වා) (D) *Saccharomyces* (සැකරෝමයසීස්)
(E) *Nephrolepis* (නෙප්රොලෙපිස්)

(01) ක්ලොරෝෆිල් b ඇති ජීවියා / ජීවීන් වන්නේ,
1. B පමණයි 2. C පමණයි 3. B හා C පමණයි
4. B, C සහ D පමණයි 5. B, C සහ E පමණයි (1987 - B)

(02) මයිටොකොන්ඩ්‍රියා නොමැති ජීවියා / ජීවීන් වන්නේ,
1. A පමණයි 2. B පමණයි 3. A හා B පමණයි
4. A සහ D පමණයි 5. A, B සහ D පමණයි (1987 - B)

(03) නිර්වායු තත්ත්ව යටතේ පමණක් වැඩෙන ජීවියා / ජීවීන් වන්නේ,
1. A පමණයි 2. C පමණයි 3. D පමණයි
4. A සහ C පමණයි 5. A සහ D පමණයි (1987 - B)

(04) එක්තරා ආවෘත බීජක ශාකයක වර්ණදේහ සංඛ්‍යාව 2n නම් එහි පහත සඳහන් කවර ව්‍යුහයක එක් එක් න්‍යෂ්ටියේ වර්ණ දේහ සංඛ්‍යාව n වන්නේද?
1. බීජාවරණය 2. පුෂ්පයක කලංකය 3. පරාග කණිකාව
4. බීජයක භ්‍රෑණපෝෂය 5. පුෂ්පයක මුකුටය (1987 - B)

(05) පහත ශාක අතුරින් කවරකට CO_2 වලින් කාබොහයිඩ්‍රේට නිපදවිය නොහැකිද?
1. *Anabena* (ඇනබිනා) 2. *Loranthus* (ලොරැන්තස්)
3. *Nitrosomonas* (නයිට්‍රොසොමොනාස්) 4. *Pseudomonas* (සියුඩොමොනාස්)
5. *Utricularia* (යුට්‍රිකියුලේරියා) (1988 - B)

(06) පහත දක්වෙන ලක්ෂණ අතරින් කවරක්/කවර ඒවා ආවෘත බීජක ශාක ගොඩබිම ප්‍රමුඛ ලෙස ඇතිරීමට හේතු වූවා විය හැකිද?
(A) ශුක්‍රාණු ගෙන යන පරාග නාලයක් තිබීම (B) සන්නායක පටකවල විකසනය
(C) බීජාණු දැරීම (D) බීජ හා ඵලවල විකසනය
(E) පොත්ත විකසනය වීම (1988 - B)

(07) විෂමපෝෂී වනුයේ පහත සඳහන් කවර ජීවියා / ජීවීන් ද?
1. *Nitrobacter* (නයිට්‍රොබැක්ටර්) 2. *Drosera* (ඩ්‍රොසෙරා)
3. *Agaricus* (ඇගරිකස්) 4. *Pseudomonas* (සියුඩොමොනාස්)
5. *Loranthus* (ලොරැන්තස්) (1989 - B)

(08) ශාක රාජධානිය පිළිබඳ සත්‍ය වන්නේ,
1. මීට වසර මිලියන 305කට පෙර ප්‍රථම ආවෘත බීජක ශාක ඇතිවිය.
2. බීජ ශාක සම්භවය වූයේ මීට වසර මිලියන 425කට පෙරය.
3. භෞමික ශාක සම්භවය වූයේ මීට වසර මිලියන 470කට පෙරය.
4. ප්‍රථම බීජ ශාක ඇතිවීම පේලියෝසොයික යුගයේ මුල් අවධියේ දී සිදුවිය.
5. ගොඩබිමට පැමිණි ප්‍රථම ශාකවල සංචිත ආහාරය සෙලියුලෝස් වේ. (1990 - B)

(09) ජීවී රාජධානි තුල සංඝටකයක් ලෙස කයිටින් අඩංගු වන්නේ,
1. දෘඩස්තර සෛල වලට ය.
2. වල්ක සෛල වලට ය.
3. බැක්ටීරියා සෛල බිත්තියෙහි ය.
4. සයනොබැක්ටීරියා (නීලහරිත) වල සෛල බිත්තියෙහි ය
5. දිලීර වල සෛල බිත්තියෙහි ය. (1991 - B)

(10) පහත සඳහන් කාණ්ඩ අතරින් කවරක් වැඩිම ශාක විශේෂ සංඛ්‍යාවක් දරයි ද?
1. ඇල්ගේ 2. බ්‍රයොපිටා 3. ටෙරිඩොපිටා
4. විවෘත බීජක 5. ආවෘත බීජක (1992 - B)

(11) භෞමික ශාකවල දක්නට ලැබෙන නමුත් ක්ලෝරොෆයිටා වල දක්නට නොලැබෙන ලක්ෂණ වන්නේ,
(A) ජන්මාණු නිපදවන පරම්පරාව (B) උච්චර්මය
(C) බිත්ති දරන මහා බීජාණු (D) අග්‍රස්ථ විභාජක
(E) ප්‍රභාසංස්ලේෂක තලය (1992 - B)

(12) ශාක භෞමික ජීවිතයකට අනුවර්තනය වීමේ දී පහත සඳහන් ඒවා අතරින් කවරක්/කවර ඒවා අවම ලෙස උපකාරී වන්නට ඇත්ද?
(A) උච්චර්මයක් තිබීම (B) සනාල පටක තිබීම
(C) සංචායක අවයව (පටක) තිබීම (D) අලිංගික ප්‍රජනනය
(E) බීජ ඇතිවීම (1994 - B)

- ප්‍රශ්න 13 සහ 14 පදනම් වී ඇත්තේ ජීවීන් ගණ 5ක් පිළිබඳව පහත දී ඇති ලක්ෂණ මතය.

ලක්ෂණ	භෞමික				
	A	B	C	D	E
සාමාන්‍ය සත්ත්වයන් යටතේ වාසස්ථානය	භෞමික	භෞමික	භෞමික	භෞමික	භෞමික
මූල පද්ධතිය	නැත	නැත	ඇත	නැත	ඇත
පුෂ්ප	ඇත	නැත	ඇත	නැත	ඇත
ස්වයංපෝෂිතයි	ඔව්	ඔව්	ඔව්	ඔව්	ඔව්
පරපෝෂී හෝ අර්ධ පරපෝෂී වේ	ඔව්	නැත	නැත	ඔව්	ඔව්
විෂමපෝෂිතයි	නැත	ඔව්	ඔව්	නැත	ඔව්

(13) ඉහත සඳහන් කවර ගණය *Loranthus* විය හැකිද?
1. A 2. B 3. C 4. D 5. E (1998 - B)

(14) ඉහත සඳහන් කවර ගණය *Nepenthus* පෙන්වන ලක්ෂණ වැඩිපුර දරන්නේ,
1. A 2. B 3. C 4. D 5. E (1998 - B)

(15) සනාල ශාක පිළිබඳ පහත වගන්ති ඇසුරින් නිවැරදි වනුයේ,
(A) වත්මන් ශාක විශේෂ අතරින් 7%ක් පමණ සනාල පටක නොදරයි.
(B) ටෙරොෆයිටාවන්ට හා බීජ ශාක වලට මෑත කාලීන පොදු පූර්වජයෙකු ඇත.
(C) කාබොනිෆෙරස් අවධි වල ශාක පරිණාමය පිළිබඳ සාක්ෂි ජීවී බීජ දරන සනාල ශාක විසින් සපයයි.
(D) පොසිල වාර්තා වලට අනුව සනාල ශාකවල පූර්වජයින්ගේ බීජාණු ශාක හා ජන්මාණු ශාක තරමින් සමාන විය.
(E) මුල් කාලීන සනාල ශාකවල මුල්වල පටක ව්‍යාප්තිය නූතන ශාකවල කඳෙහි පටක ව්‍යාප්තියට සමාන වේ. (1998 - B)

(16) *Pogonatum* පිළිබඳ පහත ප්‍රකාශ අතරින් නිවැරදි වනුයේ,
1. විෂමබීජාණුක බීජාණු ශාක තිබීම
2. සංසේචනය සඳහා බාහිර ජලය මත යැපීම
3. ඒකගෘහි හා ප්‍රමුඛ ජන්මාණු ශාක තිබීම
4. ජන්මාණු ශාකය කඳ, පත්‍ර හා මුල් ලෙස විභේදනය වීම
5. ජනමාණු ශාකවල පුටිකා සිදුරු තිබීම (1998 - B)

(17) පහත දක්වෙන ශාක කාණ්ඩ අතරින් කවරක් Whittaker (විටෙකර්) සහ තවත් අය ඉදිරිපත් කළ නූතන වර්ගීකරණ පද්ධතියේ ප්ලාන්ටේ රාජධානියට ඇතුළත් නොවන්නේද?
1. ඇන්ජියොස්පෙර්මේ 2. ජිම්නොස්පෙර්මේ 3. ටෙරිඩොපිටා
4. බ්‍රයෝපිටා 5. ක්ලෝරොපිටා (1999 - B)

(18) බීජ නොදරන සනාල ශාක පිළිබඳව සත්‍ය වනුයේ,
1. බොහෝ ශාක සමබීජාණුක වේ.
2. සියලුම ශාක පත්‍ර වල ශාඛනය වූ නාරටි තිබීම.
3. පරාධීන වූ ජන්මාණු ශාකයක් තිබීම.
4. ජන්මාණු ශාක සියල්ලම ප්‍රභාසංස්ලේෂණය සිදුකරයි.
5. ශෛම පටකය, වාහිනී, වාහකාභ, තන්තු හා මෘදුස්තර සෛල වලින් සමන්විතයි. (1999 - B)

(19) පහත ලක්ෂණ අතුරින් Dicotyledoneae වර්ගයේ සාමාන්‍ය ලක්ෂණයක් වන්නේ කුමක්ද?
1. පරිපුෂ්පය, මණිය හා මුකුටය ලෙස විභේදනය නොවීම
2. විච්ඡේදනය වූ පත්‍ර පිහිටීම
3. කඳේ සනාල කලාප විසිරී පිහිටීම
4. ජාලාභ නාරටි වින්‍යාසයක් පිහිටීම
5. සනාල කැම්බියමක් නොපිහිටීම (2001)

(20) Lycophyta වල දක්නට ලැබෙන Pterophyta වල දක්නට නොලැබෙන ලක්ෂණ වන්නේ,
(A) භෞමික වන අතර ඇතැම් විශේෂ අපිශාක වේ.
(B) බීජාණු පත්‍ර ඒකරාශී වී ගදා හැඩැති සංකේතු සාදයි.
(C) ද්විලිංගික ජන්මාණු ශාක දැරීම.
(D) සමහර විශේෂ සමබීජාණුක වීම.
(E) බහුකශිකාධර ශුක්‍රාණු දැරීම. (2004)

(21) පහත දක්වෙන කුමන වංශයකට *Selaginella* අයත් වේද?
1. ක්ලොරොෆීටා 2. බ්‍රයෝෆීටා 3. සයිකඩොෆීටා
4. ටෙරොෆීටා 5. ලයිකොෆයිටා (2008)

(22) පහත සඳහන් ඒවා අතරින් ලයිකොෆයිටාවල දක්නට ලැබෙන නමුත් ටෙරොෆයිටාවල දක්නට නොලැබෙන ලක්ෂණයක් වන්නේ කුමක්ද?
1. කශිකා පුං ජන්මාණු
2. බීජාණු පත්‍ර වල උඩ පෘෂ්ඨයට සවි වූ බීජාණුධානි
3. රයිසෝමයක් ලෙස පිහිටි කඳ
4. සරල ප්‍රාක් තලයක් ලෙස පිහිටි ජන්මාණු ශාකය
5. ලිග්නීභූත සෛල සහිත සනාල පටක (2010)

(23) ලයිකොෆයිටා කාණ්ඩයේ සාමාජිකයින්,
1. ජලජ වේ.
2. ප්‍රභාසංස්ලේෂණය සිදු නොකරන ජන්මාණු ශාක නිපදවයි.
3. සැමවිටම සමබීජාණුක වේ.
4. සනාල පටක රහිත වේ
5. සංසේචනය සඳහා බාහිර ජලය මත යැපේ (2011)

(24) ප්ලාන්ටේ රාජධානියේ ලක්ෂණ පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ කුමක්ද?
1. සෛල බිත්තිවල පෙප්ටිඩොග්ලයිකෑන් හා සෙලියුලෝස් ඇත.
2. සෛල පටලයේ ඇති ලිපිඩ බොහෝමයක් ශාඛනය වී නැත.
3. ප්‍රධාන සංචිත ආහාර ද්‍රව්‍ය වනුයේ ග්ලයිකොජන් හා පිෂ්ඨය ය.
4. ප්‍රෝටීන සංස්ලේෂණය සඳහා ආරම්භක කේතය වන්නේ ෆෝමයිල් මෙතියොනීන්ය.
5. අනෙකුත් රාජධානිවල ඇති සංවරණ ව්‍යුහ දක්නට ලැබේ. (2012)

(25) තෙත් භෞමික පරිසර වල බහුල ව හමුවන ශාකයක පහත සඳහන් ලක්ෂණ නිරීක්ෂණය කරන ලදී.
(a) සනාල පටකය
(b) ප්‍රමුඛ බීජාණුශාකය
(c) සංසේචනය සඳහා බාහිර ජලය අවශ්‍ය වීම

මෙම ශාකය බොහෝවිට අයත් විය හැකි වංශය වන්නේ,
1. බ්‍රයෝෆයිටා ය 2. ලයිකොෆයිටා ය 3. සයිකැඩොෆයිටා ය
4. කොනිෆෙරොෆයිටා ය 5. ඇන්තොෆයිටා ය (2015)

(26) මොනොකොටිලිඩොනේ වර්ගයේ දක්නට නොලැබෙනුයේ පහත සඳහන් කුමන ලක්ෂණ ද?
1. පරිපුෂ්ප 2. ත්‍රි අංක පුෂ්ප කොටස්
3. පත්‍රවල සමාන්තර නාරටි වින්‍යාසය 4. මුදුන් මුල් පද්ධතිය
5. කඳේ සනාල කලාප විසිරී තිබීම (2015)

(27) පහත සඳහන් ඒවා අතුරින් කවරක්/කවර ඒවා නිවැරදි ද?
(A) සියලු ම භෞමික ශාක වල සනාල පටක ඇත
(B) සියලු ම භෞමික ශාක විෂමබීජාණුක වේ
(C) සියලු ම භෞමික ශාකවල ප්‍රජනක අවයව නිසරු සෛල ස්තරයක් මගින් ආරක්ෂා වේ.
(D) ආවෘතබීජක ශාක හැරුණු විට අන් සියලු ම භෞමික ශාක, ජීවන චක්‍රයේ ද්විත්ව සංසේචනයක් නොදක්වයි.
(E) සියලු ම භෞමික ශාක, භෞමික ජීවිතයට අනුවර්තනයක් ලෙස බීජ නිපදවයි (2015)

(28) *Marchantia* වලට පරිණාමික ව වඩාත් ම ආසන්න වන්නේ පහත සඳහන් කුමන ශාකයද?
1. *Anthoceros* 2. *Selaginella* 3. *Gbetum*
4. *Pogonatum* 5. *Nephrolepis* (2019)

නිපුණතාව 3.2.5 : දිලීර රාජධානියේ ජීවීන්ගේ විවිධත්වය

(01) බැක්ටීරියා සෛලයක් *Mucor* (මියුකෝ) බීජාණුවකින් වෙනස් වන්නේ *Mucor* (මියුකෝ) බීජාණුවෙහි,
(A) මයිටොකොන්ඩ්‍රියා ඇති බැවිනි (B) න්‍යෂ්ටියක් ඇති බැවිනි
(C) සෛල බිත්තියක් ඇති බැවිනි (D) ප්‍රවේනි ද්‍රව්‍ය ඇති බැවිනි
(E) එන්සයිම ඇති බැවිනි (1986 - B)

(02) දිලීර රාජධානිය පිලිබඳ පහත ප්‍රකාශ වලින් සත්‍ය වන්නේ,
1. *Mucor* අලිංගික ප්‍රජනනයේදී ප්‍රවේණිකව සර්ව සමාන ද්විගුණ අන්තර්ජන්‍ය බීජාණු සාදයි.
2. *Rhizopus* දිලීරයේ කිසිදු විටෙක ආවාර දක්නට නැත.
3. *Chytridiomycota* වංශයේ දිලීර පරපෝෂිත හා සහභෝජී වේ.
4. බහු සෛලික දිලීර පෝෂ්‍ය පදාර්ථ අවශෝෂණය සඳහා දිලීර ජාලයක් සාදයි.
5. සියලුම දිලීර බහුසෛලික සූත්‍රිකාමය දේහ (Hyphae) දරයි. (1986 - B)

(03) ද්විනයෂ්ටික සෛල ලාක්ෂණිකව දක්නට ලැබෙන්නේ පහත සඳහන් කවරේද?
1. *Agaricus* (ඇගැරිකස්) ද්විතීය සූත්‍රිකාවල
2. *Agaricus* (අගැරිකස්) බැසිඩියමේ බැසිඩි බීජාණු නිපදවීමෙන් අනතුරුව
3. *Agaricus* (ඇගැරිකස්) හි ප්‍රාථමික දිලීර ජාලයේ
4. *Allomyces* (ඇලෝමයිසිස්) හි වර්ධක දිලීර ජාලයේ
5. *Spirogyra* (ස්පයිරොගයිරා) හි පරිණත සූත්‍රිකාවල (1987 - B)

(04) බැක්ටීරියා සෛල හා දිලීර සෛල සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ අතරින් කවරක් වැරදි ද?
1. සෛල දෙවර්ගයේම රයිබසෝම දක්නට ලැබේ.
2. සෛල දෙවර්ගයේම අනූනන විභාජනය සිදුවිය හැකිය.
3. සෛල දෙවර්ගයේම සෛල බිත්ති දක්නට ලැබේ.
4. දිලීර සෛලවල මයිටොකොන්ඩ්‍රියා දක්නට ලැබෙන අතර බැක්ටීරියා සෛල වල මයිටොකොන්ඩ්‍රියා දක්නට නොලැබේ.
5. දිලීර සෛලවල න්‍යෂ්ටි දක්නට ලැබෙන අතර බැක්ටීරියා සෛල වල න්‍යෂ්ටි දක්නට නොලැබේ. (1988 - B)

(05) *Ascomycetes* සම්බන්ධයෙන් පහත සඳහන් ඒවා අතරින් කවරක්/කවර ඒවා නිවැරදි වේද?
(A) බහිර්ජන්‍ය බීජාණු දාම හෝ පොකුරු ලෙස ඇතිවේ.
(B) ලිංගික බීජාණු අන්තර්ජන්‍ය වේ
(C) ඇතැම් අස්කොමිසේටේස් ඒක සෛලීය වේ
(D) බොහෝ ආකාර වියෝජකයෝය.
(E) අස්කොමිසේටේස් වලට අයත් ඇතැම් ගණ ප්‍රයෝජනවත් ප්‍රතිජීවක නිපදවයි (1988 - B)

(06) වැරදි ප්‍රකාශය/ප්‍රකාශ තෝරන්න.
(A) වයිරස සියල්ල පරපෝෂිත වේ
(B) දිලීර සියල්ල විෂමපෝෂී වේ
(C) එන්සයිම සියල්ල තාප අස්ථායී වේ
(D) හෝර්මෝන සියල්ල ප්‍රෝටීන වේ.
(E) බීජ ශාක සියල්ල ස්වයංපෝෂී වේ. (1989 - B)

(07) නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. කොනිඩ්වල කශිකා තිබිය හැකිය.
2. අස්ක බීජාණු බහිර්ජන්‍ය ලෙස නිපදවේ.
3. බැසිඩි බීජාණු ප්‍රරෝහණය වීමෙන් ද්විතියික දිලීර ජාල ඇති වේ.
4. සංයෝගාණු ඇති වන්නේ රූපීයව සමාන ජන්මාණුධානි හාවීමෙනි.
5. *Mucor* (මියුකෝර්) බීජාණුධානිය තුළ වල බීජාණු ඇතිවේ. (1990 - B)

(08) *Saccharomyces* පිළිබඳව පහත දක්වෙන ප්‍රකාශ අතරින් කවරක් වැරදි ද?
1. පාන් සෑදීම සඳහා එය උපයෝගී වේ.
2. එය වෛකල්පිත නිර්වායු ශ්වසන ජීවියෙකි.
3. එහි සාමාන්‍ය ප්‍රජනන ක්‍රමය අංකුරනයයි.
4. යෝගට් නිෂ්පාදනය සඳහා එය වැදගත් වේ.
5. එය සූන්‍යෂ්ටික ජීවියෙකි. (1991 - B)

(09) පහත ප්‍රශ්නය සඳහා පහත ගණ මත පදනම් වේ.
A. *Sacharomyces* B. *Aspergillus* C. *Clostridium*
D. *Agarcus* E. *E.coli*
ඉහත සඳහන් ජීවීන්ගෙන් කවරකට ස්වායු තත්ත්වයන් යටතේ ජීවත් විය නොහැකිද?
1. A පමණි 2. C පමණි 3. A, B හා C පමණි
4. A හා C පමණි 5. A හා E පමණි (1991 - B)

(10) දිලීර වල ප්‍රජනනය පිළිබඳ සත්‍ය වන්නේ,
(A) Zygomycota ලිංගික ප්‍රජනනයේදී සාදන සංයෝගානුව බහුන්‍යෂ්ටික වේ.
(B) Ascomycota අලිංගක ප්‍රජනනයේදී කොනිඩ්ධර නිපදවයි.
(C) Ascomycota ලිංගික ප්‍රජනනයේදී බහිර්ජන්‍ය අස්ක බීජාණු 8ක් සාදයි.
(D) *Agaricus* ද්වින්‍යෂ්ටික ආවාර සහිත සූත්‍රිකා දරයි.
(E) Basidiomycota වංශය තුල පරපෝෂීන් සහ සහජීවීන් වෙසේ. (1991 - B)

(11) සෛල බිත්තියේ සෙලියුලෝස් නොමැත්තේ,
(A) Anabaena (B) *Gnetum* (C) *Aspergillus*
(D) *Rhizobium* (E) *Mangifera* (1993 - B)

G.C.E. Advanced Level | Biology | Unit 3

(12) පහත සඳහන් ප්‍රකාශන අතරින් කවරක්/කවර ඒවා වැරදිද?
(A) වෛරස සියල්ලම අනිවාර්ය පරපෝෂිතයන්ය
(B) දිලීර සියල්ලම විෂමපෝෂීන් ය.
(C) බැක්ටීරියා සියල්ලම විෂමපෝෂීන් ය.
(D) දිලීර සියල්ලම මෘතෝපජීවීන්ය.
(E) ඇල්ගේ සියල්ලම ස්වයංපෝෂීන් ය. (1994 - B)

(13) බැසිඩියොමිසේටේ ගැන පහත දක්වෙන ප්‍රකාශ අතරින් කවරක් නිවැරදි ද?
1. වර්ධක දිලීර ජාලය ආවාර සහිතව අතු බෙදී ඇත.
2. ද්විතියික දිලීර ජාල ද්වින්‍යෂ්ටිකය.
3. මෙම කාණ්ඩයේ ඇතැම් සාමාජිකයින් දුව දිරාපත් කිරීමෙහි වැදගත් කාර්යයක් ඉටු කරයි.
4. බැසීඩ් ඵලයේ තැලි මත බැසීඩ් බීජාණු නිපදවයි
5. ලිංගික බීජාණු අන්තර්ජන්‍ය වේ. (1995 - B)

(14) පහත දක්වෙන ප්‍රකාශ අතරින් කවරක් නිවැරදි ද?
1. ඇස්කබීජාණු බහිර්ජන්‍ය ලෙස බිහි වේ.
2. *Aspergillus* වල ජන්මාණු නිපදවයි.
3. බැසිඩිබීජාණු ප්‍රරෝහණයෙන් ද්විතීයික දිලීර ජාලය බිහි වේ.
4. *Chytridium* සංසෛලීය බව පෙන්නුම් කරයි.
5. බැසිඩිබීජාණු බැසිඩියම තුළ ඇති වේ. (1996 - B)

(15) වෛරස දිලීර වලින් වෙනස් වන්නේ ඒවා,
1. ලිංගික ප්‍රජනනයක් නොපෙන්වන නිසාය.
2. අනිවාර්ය පරපෝෂිතයින් නිසාය.
3. පියවි ඇසට නොපෙනෙන නිසාය.
4. සංවිධානය වූ න්‍යෂ්ටියක් නොදරන නිසාය
5. ධාරක විශිෂ්ටත්වය පෙන්වන නිසාය. (1996 - B)

(16) පහත සඳහන් ප්‍රකාශ අතරින් කවරක්/කවර ඒවා ඇස්කොමයිසීට (Ascomycete) සම්බන්ධයෙන් නිවැරදි ද?
1. වර්ධක අවස්ථා සැමවිට ම නිරාවාර ශාකනය වූ සූත්‍රිකා වලින් යුක්ත වේ.
2. ලිංගික බීජාණු බහිර් ජන්‍ය වේ.
3. අලිංගික බීජාණු බහිර් ජන්‍ය වේ.
4. සමහර සාමාජිකයින් ඒකසෛලික වේ.
5. සූත්‍රිකාවල කලම්ප මං දක්නට ඇත. (1997 - B)

(17) *Agaricus* වල ද්විතීයික දිලීර ජාලයේ ආවාර වලින් සීමා වූ සෑම ඛණ්ඩයක ම ඇත්තේ,
1. සර්වසම ඒකගුණ න්‍යෂ්ටි යුගලයකි.
2. සර්වසම ද්විගුණ න්‍යෂ්ටි යුගලයකි.
3. ලිංගිකව එකිනෙකට ගැලපෙන ඒකගුණ න්‍යෂ්ටි යුගලයකි.
4. ඒක ඒකගුණ න්‍යෂ්ටියකි.
5. එක් ද්විගුණ න්‍යෂ්ටියකි. (1998 - B)

(18) පහත සඳහන් කවරක් දිලීරයක දර්ශීය ගුණාංගයක් නොවේද?
1. මොවුන් සූත්‍රිකාමය වේ.
2. සූන්‍යෂ්ටික සෛල සංවිධානයක් ඇත.
3. මොවුන් බාහිර පරිසරයෙන් පෝෂක ලබාගනී
4. මොවුන්ට සෛල බිත්ති ඇත.
5. මොවුන් අනිවාර්ය නිර්වායු ජීවීන් ය. (1998 - B)

(19) දිලීර බැක්ටීරියා වලින් වෙනස් වනුයේ දිලීර,
1. මෘතෝපජීවී බැවිනි
2. අවශෝෂක පෝෂණයක් දක්වන බැවිනි
3. ප්‍රතිජීවක නිපදවන බැවිනි
4. සූන්‍යෂ්ටික බැවිනි
5. අලිංගික ලෙස ප්‍රජනනය කරන බැවිනි. (2000)

(20) දිලීර පිළිබඳ පහත සඳහන් ඒවා අතුරින් කවරක් නිවැරදිද?
1. බීජාණු නිපදවන්නේ අලිංගික ප්‍රජනනයේ දී පමණි.
2. ආවාර වල සිදුරු රහිත වේ.
3. බහිස්සෛලීය එන්සයිම ස්‍රාවය කරයි.
4. ප්‍රජනනයේදී සෛල ප්ලාස්මයේ සංයෝජනය හා න්‍යෂ්ටිවල සංයෝජනය එකවර සිදුවේ.
5. ප්‍රජනනයේදී කශිකාධර සෛල ඇති වේ. (2001)

(21) පහත සඳහන් ඒවා අතරින් කවරක් වැරදි ද?
1. සියලු ම දිලීර නම්‍යශීලී පොලිසැකරයිඩ දරයි.
2. සියලු ම වෛරස පරපෝෂීන් වේ.
3. සියලු ම බැක්ටීරියා රසායනික ස්වයංපෝෂීන් නොවේ.
4. සියලු ම දිලීර සූත්‍රිකාමය නොවේ.
5. සියලු ම බැක්ටීරියා ද්විඛණ්ඩනයෙන් ප්‍රජනනය කරයි. (2010)

(22) දිලීර වල ලාක්ෂණික ගුණයක් වන්නේ,
1. ග්ලයිකොපෙප්ටයිඩ වලින් තැනුන සෛල බිත්ති තිබීමයි.
2. විෂමපෝෂී අවශෝෂණ පෝෂණයක් තිබීමයි.
3. ආහාර අධිග්‍රහණය කර ජීර්ණය කිරීමයි.
4. ආහාර පිෂ්ටය ලෙස තැන්පත් කිරීමයි.
5. අන්තඃබීජාණු මගින් ප්‍රජනනය කිරීමයි. (2018)

නිපුණතාව 3.2.6 : සත්ත්ව රාජධානියේ ජීවීන්ගේ විවිධත්වය
3.2.7 : කෝඩේටා වංශයට අයත් ජීවීන්ගේ විවිධත්වය

(01) පහත සඳහන් කවරෙකු ඩියුටෙරොස්ටෝමයෙකු වන්නේද?
1. ගැඩවිලා 2. කුඩැල්ලා 3. ගොළුබෙල්ලා
4. කැරපොත්තා 5. ඉකිරියා (1986 - Z)

(02) හොඳින් විකසනය වූ සීලෝමයක් සහිත සතුන් ඇතුළත් වන්නේ පහත සඳහන් කුමකටද?
1. Arthropoda 2. Annelida 3. Echinodermata
4. Platyhelminthes 5. Nematoda (1986 - Z)

(03) (a) කෘමීන් (b) මකුළුවන් (c) ක්‍රස්ටේසියාවන්
(d) පත්තෑයින් (e) හැකරැල්ලන්
භෞමික සතුන් සංඛ්‍යාවක් අඩංගු වුවද වැඩි වශයෙන් ම ජලජ වන්නේ මේවායින් කිනම් කාණ්ඩයද?
1. a 2. b 3. c 4. d 5. e (1987 - Z)

(04) ඇනිමාලියා රාජධානියේ ජීවීන් සතු පොදු ලක්ෂණයක් වන්නේ,
1. ඒක සෛලික හෝ බහුසෛලික වීම.
2. ආහාර එන්සයිම ආධාරයෙන් ජීර්ණය කිරීම.
3. ආහාර ජීර්ණය සඳහා විශේෂණය වූ ආහාර මාර්ගයක් තිබීම.
4. සියලුම සතුන් ලිංගික ප්‍රජනනයය පමණක් පෙන්වීම.
5. සියලුම සතුන් අරීය සමමිතිය පෙන්වයි. (1987 - Z)

(05) පහත දක්වෙන කාණ්ඩ අතරින් මිරිදියෙහි නියෝජිතයන් නොමැති එක වන්නේ,
1. Coelenterata 2. Mollusca 3. Echinodermata
4. Nematoda 5. Annelidada (1988 - Z)

(06) ග්‍රන්ථි රහිත හෝ සුළු වශයෙන් ග්‍රන්ථි සහිත කොරලමය චර්මයක් විශිෂ්ට ලක්ෂණයක් වනුයේ,
1. මත්ස්‍යයන්ගේය 2. උරගයන්ගේය 3. පක්ෂීන්ගේය
4. චවුලන්ගේය 5. තල්මසුන්ගේය (1988 - Z)

(07) පහත සඳහන් ලක්ෂණ අතරින් එයට ඉදිරිපිට දක්වා ඇති කාණ්ඩය වෙන්කොට හඳුනාගත හැකි ලක්ෂණය නොවන්නේ කුමක්ද?
1. අරීය සමමිතිය - Echinodermata
2. කුහරමය ස්නායු රජ්ජුව - Chordata
3. කයිටිනීය බාහිර සැකිල්ල - Arthropoda
4. රේත්‍රිකාව - Mollusca
5. දංශක කෝෂ්ඨ - Coelenterata (1988 - Z)

(08) පහත සඳහන් ඒවායින් පක්ෂ්ම හමු නොවන්නේ කුමන එකේද?
1. Annelida 2. Arthropoda 3. Echinodermata
4. Mollusca 5. Platyhelminthes (1989 - Z)

(09) දංශක කෝෂ්ඨ හමුවන්නේ,
1. Annelida 2. Coelenterata 3. Mollusca
4. Nematoda 5. Platyhelminthes (1989 - Z)

(10) Platyhelminthes වංශයේ ජීවීන් සතු ලක්ෂණයක්/ලක්ෂණ වන්නේ,
(A) ආහාර ජීර්ණය සඳහා ශාඛනය වූ ආමාශ වාහිනී කුහරයක් ඇත.
(B) නිදලිවාසීන් කීට ආකාර කිහිපයක් දරන අතර පරපෝෂිතයන් කීට ආකාර රහිතව වර්ධනය වේ.
(C) මුඛය සහ ගුදය සහිත අසම්පූර්ණ ආහාර ජීර්න පද්ධතියක් ඇත.
(D) සංසරණ, ස්නායු, සැකිලි පද්ධති නොමැති අතර ඇතැමුන්ගේ හිසේ අක්ෂි ලප ඇත.
(E) බහිස්‍රාවය සඳහා වෙනම අවයව ලෙස වෘක්කිකා පවතී (1989 - Z)

(11) Cnidaria වංශයේ ජීවීන් පිළිබඳ සත්‍ය වන්නේ,
a) සරල ආමාශවාහිනී කුහරය අසෛලීය මධ්‍ය ශ්ලේෂය තුල පිහිටන අතර මුඛයෙන් බාහිරට විවෘත වේ.
b) ඇතැම් නිඩාරියාවන්ගේ ජීවන චක්‍රයේ බුහුබා සහ මෙඩුසා යන ආකාර දෙකම පවතී.
c) දංශක සෛල වල විදිය හැකි තන්තුවක් ඇත.
d) සියල්ල ද්විප්‍රස්තරික හා මහාජීවීන් වේ.

1. a හා b පමණි 2. a හා c පමණි 3. සියල්ලම නිවැරදි වේ.
4. a, b හා c පමණි 5. b හා c පමණි (1989 - Z)

(12) මිනිසා,
1. ද්විනේත්‍රික දෘෂ්ඨිය සහිත
2. කථා කිරීමේ හැකියාව ඇති
3. අත් පා වල ඇඟිලි පැතලි නිය සහිත
4. ආයුධ භාවිතා කිරීමේ හැකියාව ඇති
5. වලිගයක් රහිත එකම ප්‍රිමාටේවාය. (1990 - Z)

(13) සත්ත්ව වර්ගීකරණය,
1. ප්‍රධාන වශයෙන් අධ්‍යයනය කිරීමේ පහසුව සඳහා කරනු ලැබේ.
2. හඳුනා ගැනීම සඳහා යතුරු සෑදීමට උපකාරී වේ.
3. සත්ත්ව විද්‍යාවෙහි වැදගත් අංශයක් නොවේ.
4. වංශප්‍රවේණික බන්ධුතා දක්වීමට උපකාරී වේ.
5. ශාක වර්ගීකරණය සඳහා උපයෝගී වන මූලධර්ම වලින් වෙනස් වේ. (1990 - Z)

(14) පහත සඳහන් ලක්ෂණ අතුරින් උරගයින්ට භෞමික අනුවර්තනයක් ලෙස අත්‍යවශ්‍ය නොවන්නේ කුමන ලක්ෂණයද?
1. වියළි කොරලමය හම 2. වලිගය
3. යුරික් අම්ලය බහිස්‍රාවී ඵලයක් වීම 4. පෙනහැලි
5. පටල සහ කවචයකින් යුත් බිත්තරය (1990 - Z)

(15) පහත සඳහන් ලක්ෂණ අතරින් පත්තෑයකු සහ හැකරැල්ලකු අතර වූ වෙනස්කමක් නොවන්නේ කවර ලක්ෂණයද?
1. දේහයේ පෙදෙස් 2. එක් ඛණ්ඩකයක පිහිටි ගාත්‍රා ගණන
3. ශරීරයෙහි හැඩය 4. ඛණ්ඩනය
5. ප්‍රජනක විවර පිහිටි ස්ථානය (1990 - Z)

(16) පහත සඳහන් කාණ්ඩ අතුරින් සීලෝමය හා ඛණ්ඩනය යන දෙකම දක්නට ලැබෙන්නේ කුමන කාණ්ඩයෙහි ද?
1. Annelida 2. Coelenterata 3. Nematoda
4. Mollusca 5. Platyhelminthes (1990 - Z)

(17) නාල පාද,
1. Annelida 2. Mollusca 3. Coelenterata
4. Platyhelminthes
5. Echinodermata වන්ගේ පමණක් දක්නට ලැබෙන සංචරණ ව්‍යුහයන්ය.
(1990 - Z)

(18) මධ්‍යශ්ලේෂය ආවේණික ස්තරයක් වන්නේ,
1. Annelida 2. Coelenterata 3. Mollusca
4. Nematoda 5. Platyhelminthes වන්ගේය. (1990 - Z)

(19) පහත සඳහන් ලක්ෂණ අතුරින් පක්ෂීන් සහ සජීවී උරගයින් යන දෙකොට්ඨාශයේම දක්නට ලැබෙන්නේ කුමන ලක්ෂණය ද?
1. පිහාටු 2. හොට 3. පියාපත 4. වියළි හම 5. ද්විපාද විලාසය
(1990 - Z)

- ප්‍රශ්න අංක 20 හා 21 පහත සඳහන් වංශ මත පදනම් වී ඇත.

(A) Chordata (B) Echinodermata (C) Mollusca
(D) Platyhelminthes (E) Annelida

(20) අභ්‍යන්තර සැකිලි දක්නට නොලැබෙන්නේ,
1. A හා B ගේය 2. B හා C ගේය 3. C හා D ගේය
4. D හා E ගේය 5. A හා E ගේය (1991 - Z)

(21) හොඳින් විකසනය වූ සීලෝමයක් තිබෙන්නේ,
1. A හා B ගේය 2. B හා C ගේය 3. C හා D ගේය
4. D හා E ගේය 5. A හා E ගේය (1991 - Z)

(22) මත්ස්‍යයින්ගේ පහත සඳහන් ලක්ෂණ අතරින් ජලීය ජීවිතයකට කෙලින්ම සම්බන්ධ නොවන්නේ කුමක්ද?
1. දේහයෙහි හැඩය 2. ජලක්ලෝම 3. සංගල වරල්
4. චර්මීය කොරළ 5. ශ්ලේෂ්මල ග්‍රන්ථි (1991 - Z)

(23) පහත සඳහන් ලක්ෂණ අතරින් උරගයින් සහ පක්ෂීන් යන දෙකොට්ඨාශයටම අයත් ලක්ෂණයක නොවන්නේ කුමක්ද?
1. කවචයකින් වට වූ බිත්තර දැමීම
2. සම වියළි වීම
3. දේහයෙහි කුමන කොටසක හෝ කොරළ තිබීම
4. අපර ගාත්‍රා තිබීම
5. සැකිල්ල සැහැල්ලු වීම (1991 - Z)

(24) පහත සඳහන් කාණ්ඩ අතරින් ජීවී විශේෂ වැඩිම සංඛ්‍යාවක් අයත් වන කාණ්ඩය කුමක්ද?
1. පක්ෂීන් 2. කෘමීන් 3. මත්ස්‍යයින්
4. ප්‍රෝටසෝවාවන් 5. මොලුස්කාවන් (1991 - Z)

(25) Nematoda වංශයේ ජීවීන් සතු ලක්ෂණයක් වන්නේ,
1. දේහය තුනී උච්චර්මයකින් ආවරණය වන අතර හැව හැලීම සිදුකරයි.
2. ශ්වසන වායු හුවමාරුව සරල විසරණයෙන් සිදුකරයි.
3. දේහ බිත්තියේ වෘත්තාකාර පේශි පිහිටන අතර විශේෂ සංචරණ ව්‍යුහ නැත.
4. බොහෝමයක් මිරිදිය නිදැලිවාසීන් වන අතර ශාක හා සතුන් තුළ පරපෝෂිතයන් ලෙස හමුවේ.
5. ඒකලිංගික වන අතර බාහිර සංසේචනය සිදුකරයි. (1991 - Z)

(26) පහත සඳහන් වර්ගීකරණ කාණ්ඩ අතරින් එකිනෙකට ඉතා කිට්ටු සමානතාවක් සහිත සත්ත්වයන් අයත් වන්නේ කුමන කාණ්ඩයට ද?
1. Plylum 2. Kingdom 3. Family 4. Order 5. Species
(1992 - Z)

(27) Chordata වන් වෙනත් Plylum එකක් හෝ වැඩි ගණනක් සමඟ පොදුවේ පෙන්නුම් කරන්නේ පහත සඳහන් කුමන ලක්ෂණයද?
1. සත්‍ය වෘක්කය 2. උදරීය හෘදය 3. අස්ථිමය හනු
4. පශ්ච ගුද වලිගය 5. අභ්‍යන්තර සැකිල්ල (1992 - Z)

(28) පහත සඳහන් වගන්ති අතරින් වැරදි වගන්තිය කුමක්ද?
1. Annelida ගේ බහිස්‍රාවී අවයවය වෘක්කිකාවය.
2. Platyhelminthes හි නිදැල්ලේ වෙසෙන ආකාරයන් ද අයත්ය.
3. Nematoda වන්ගේ දේහ කුහරය ව්‍යාජ සීලෝමයකි.
4. විශාලතම අපෘෂ්ඨවංශී සත්ත්වයා දක්නට ලැබෙන්නේ Echinodermata වන් අතරේය.
5. මොලුස්කාවන් තුල කයිටිනීමය ව්‍යුහ දැකිය හැක. (1992 - Z)

(29) විශාලම විවිධත්වයක් පෙන්නුම් කරන සත්ත්ව Phylum එක වන්නේ,
1. Chordata 2. Mollusca 3. Nematoda
4. Platyhelminthes 5. Arthropoda (1992 - Z)

(30) Annelida වංශයේ ජීවීන් සතු ලක්ෂණයක්/ලක්ෂණ වන්නේ,
(A) උදරීය ස්නායු රැහැනක් පිහිටන අතර ත්‍රිප්‍රස්තරික වේ.
(B) අංශපාදිකා සංචරණයට වැදගත් වන අතර දෘඩි කෙඳි සංචරණය හා ශ්වසනය යන දෙකටම වැදගත් වේ.
(C) මිරිදිය හා තෙත් භෞමික පරිසර වල පමණක් වාසය කරයි.
(D) විවෘත රුධිර සංසරණ පද්ධතියක් මුල් වරට විකසනය වූයේ මොවුන්ගේ ය.
(E) සත්‍ය සීලෝමය ප්‍රථම වරට මොවුන්ගේ විකසනය වූ අතර බාහිර පරපෝෂී ආකාර වලට චූෂකර දක්නට ඇත (1992 - Z)

(31) පහත සඳහන් වගන්ති අතරින් වැරදි වනුයේ කුමක්ද?
1. මොලුස්කා බහුතරය කරදියවාසීන්ය.
2. Platyhelminthes ත්‍රිප්‍රස්තර සත්ත්වයින්ය.
3. Coelenterata ද්විප්‍රස්තර සත්ත්වයින්ය.
4. සියලු වංශ අතරෙන් වැඩිම විශේෂ සංඛ්‍යාවක් අයත් වන්නේ Arthroopda වය.
5. වැරහැලි පණුවා ඩියුටෙරොස්ටෝමියාවන්ගේ දක්නට ලැබේ. (1993 - Z)

(32) පහත සඳහන් ඒවා අතරින් Phylum Mollusca ට පමණක් සීමා වූ ලක්ෂණය කුමක්ද?
1. ප්‍රාවරණය, පේශිමය පාදය සහ අන්තරංග ගොනුව සහිත මෘදු දේහය.
2. සීලෝමය විශාල වශයෙන් රුධිරහෙබ මගින් ප්‍රතිස්ථාපනය වී තිබීම.
3. චූර්ණමය බාහිර කවචය.
4. ජලක්ලෝම තිබීම. 5. ද්විලිංගිකතාව (1993 - Z)

(33) උරගයින්ගේ පහත සඳහන් ලක්ෂණ අතරින් කවරක් භෞමික ජීවිතයක් සඳහා වූ අනුවර්තනයක් ලෙස සැලකිය නොහැකිද?
1. රුධිර වර්ණකය ලෙස හිමොග්ලොබින් තිබීම
2. කවචයකින් ආවරණය වූ බිත්තරය.
3. පිරිමි සතුන්ගේ ශිෂ්ණයක් තිබීම.
4. ප්‍රධාන බහිස්‍රාවී ඵලය යූරික් අම්ලය වීම
5. පාංචාංගුලික ගාත්‍රා තිබීම. (1993 - Z)

(34) පහත සඳහන් වගන්ති අතරින් Class Aves පිළිබඳ අසත්‍ය වනුයේ කුමක්ද? ක්නට ලැබේ.
1. පියාසර කිරීමට හැකියාවක් දක්වන එකම පෘෂ්ඨවංශී කාණ්ඩය මොවුන්ය.
2. ඔව්හු කොරළ සහ පිහාටු යන දෙකම දරති.
3. ඔවුන්ගේ හනු දත් නොදරයි.
4. ඔවුන්ගේ අස්ථි වැඩි ප්‍රමාණයක් කුහරමය වේ.
5. විශේෂ පිහාටු කාණ්ඩයක් පියාපතෙහි පෘෂ්ඨය සාදයි. (1993 - Z)

(35) කෘමීන්ගේ දක්නට ලැබෙන පහත සඳහන් ලක්ෂණ අතරින් ක්‍රස්ටේසියාවන්ගේ දක්නට නොලැබෙන්නේ කුමක්ද?
1. කයිටිනීය පිටසැකිල්ල 2. මැල්පිගීය නාලිකා 3. ටැග්මීකරණය
4. ස්පර්ශක 5. සංයුක්ත අක්ෂි (1994 - Z)

(36) Mollusca වංශයේ ජීවීන් සතු ලක්ෂණයක් වන්නේ,
1. දේහය හිස, පේශිමය පාදය හා අන්තරංග ගොනුව ලෙස කොටස් 3 කි.
2. සියල්ලන්ම ද්විපාර්ශ්වික සමමිතික දේහ දරයි.
3. ආරක්ෂාව සඳහා කයිටිනීමය බහිස් සැකිල්ලක් ස්‍රාවය කරගෙන ඇත.
4. කවචය අභ්‍යන්තර හෝ බාහිර විය හැකි අතර බහුතරයක් මිරිදියවාසී වේ.
5. ප්‍රජනක අවයව අන්තරංග ගොනුව තුළ අන්තර්ගතය (1993 - Z)

(37) වර්ගීකරණයේ දී වඩාත් ම දුරස්ථ බන්ධුතාවයක් දක්වන සතුන් කාණ්ඩ කර ඇත්තේ,
1. Phylum යටතේ ය. 2. Class යටතේ ය. 3. Order යටතේ ය.
4. Family යටතේ ය. 5. Genus යටතේ ය. (1994 - Z)

(38) පහත සඳහන් වගන්ති අතරින් සත්ත්ව රාජධානිය පිළිබඳ අසත්‍ය වනුයේ කුමක්ද?
1. මුලින්ම ශීර්ෂණයක් පෙන්නුම් කළේ ප්ලැටිහෙල්මින්තේසයන් ය.
2. සීලෙන්ටරේටාවන් අතර පරපෝෂිත ආකාර නොමැත.
3. මුලින්ම පේෂි පද්ධතියක් විකසනය වූයේ ඇනලිඩාවන්ගේ ය.
4. රේත්‍රිකාව මොලස්කාවන්ට පමණක් සීමා වේ.
5. පංචඅරීය සමමිතිය එකයිනොඩර්මේටාවන්ගේ ආවේණික ලක්ෂණයකි.
(1995 - Z)

(39) පහත සඳහන් වංශ අතරින් පිටසැකිල්ලක් සහිත සාමාජිකයන් අන්තර්ගත නොවන්නේ කුමකටද?,
1. Coelenterata 2. Arthropoda 3. Mollusca
4. Echinodermata 5. Chordata (1995 - Z)

(40) පහත සඳහන් අවයව පද්ධති අතරින් සත්ත්ව රාජධානිය තුළ අන්තිමට ඇති වූ අවයව පද්ධතිය කුමක්ද?
1. පේශි පද්ධතිය 2. ශ්වසන පද්ධතිය 3. ප්‍රජනන පද්ධතිය
4. සංසරණ පද්ධතිය 5. බහිස්‍රාවී පද්ධතිය (1995 - Z)

(41) Arthropoda වංශයේ ජීවීන් සතු ලක්ෂණයක්/ලක්ෂණ වන්නේ,
(A) ඒකලිංගික වන අතර භෞමිකවාසීන්ට කියුටිනීමය නාල සහිත ශ්වාසනාල පද්ධති ඇත.
(B) ඛණ්ඩනය වූ දේහය මත චූර්ණිභූත බහිස්සැකිල්ලක් සැමවිටම ඇත.
(C) විවෘත රුධිර සංසරණ පද්ධතියක් ඇත.
(D) ඛණ්ඩනය වූ ඝන ස්නායු රැහැනක් උදරීයව පිහිටයි.
(E) හෘදය මගින් පොම්ප කරන රුධිරය රුධිර කේශනාලිකා මගින් පටක දක්වා ගෙනයයි. (1995 - Z)

(42) යකඩ සහිත ශ්වසන වර්ණකයක් දිය වූ රුධිර ප්ලාස්මයක් ඇත්තේ,
1. ක්‍රස්ටේසියාවන්ට ය 2. ඇනලිඩාවන්ට ය 3. උභයජීවීන්ට ය
4. පක්ෂීන්ට ය 5. උරගයින්ට ය (1996 - Z)

(43) පක්ෂීන්ගේ පියාසැරිය සඳහා අඩුවෙන් ම වැදගත් වන ලක්ෂණය වන්නේ,
1. බිත්තර දැමීමේ පුරුද්ද 2. වායවමය වූ අස්ථි තිබීම ය
3. උරතලයේ නෞතලයක් විසනය වීම ය 4. න්‍යෂ්ටි සහිත රක්තාණු තිබීම ය
5. මුත්‍රාශයක් නොතිබීමය (1996 - Z)

(44) පහත සඳහන් ලක්ෂණ අතරින් එක් සත්ත්ව වංශයකට පමණක් සීමා වූ ලක්ෂණයක් නොවන්නේ,
1. ඒකසෛලීය දේහ ආකාරය 2. ජලවාහිනී පද්ධතිය 3. රේත්‍රිකාව
4. විවෘත සංසරණ පද්ධතිය 5. ග්‍රසනික පැලුම් (1996 - Z)

(45) ස්වභාවික වර්ගීකරණය සැමවිටම,
1. පරිණාමික බන්ධුතා පෙන්නුම් කිරීමට උපකාරී වේ.
2. සත්ත්වයන්ට ඔවුන්ට පමණක් සීමා වූ නාමයන් දීමට උපකාරී වේ.
3. පුරෝකථන හැකියාව අඩු කිරීමට උපකාරී වේ.
4. සමප්‍රභව ව්‍යුහ වෙන්කර ගැනීමට උපකාරී වේ.
5. විශේෂයන් හඳුනා ගැනීමට උපකාරී වේ. (1996 - Z)

(46) පහත සඳහන් ඒවා අතරින් සියලු ම ආත්‍රොපෝඩාවන්ට පොදු නොවන්නේ,
1. ටැග්මීකරණය 2. පිටසැකිල්ල 3. රුධිර හෙබ
4. ශ්වාසනාල 5. සන්ධි පාද (1996 - Z)

(47) Echinodermata වංශයේ ජීවීන් සතු ලක්ෂණයක්/ලක්ෂණ වන්නේ,
(A) පරිණත ජීවීන්ගේ ඛණ්ඩනය හා ශීර්ෂණය දක්නට නැත.
(B) සාමාන්‍යයෙන් ආහාර ජීර්ණ පද්ධතිය සම්පූර්ණයි.
(C) ඵලක සහිත අන්තඃසැකිල්ල දෘඩ අපිචර්මයකින් ආවරණය වේ.
(D) ද්විපාර්ශ්වික සමමිතිය දරන කීට අවස්ථා ඇත.
(E) හෘදයක් සහිත වන අතර බාහිර සංසේචනය සිදකරයි. (1996 - Z)

(48) Chondrichthyes වර්ගයේ ජීවීන් සතු ලක්ෂණයක්/ලක්ෂණ වන්නේ,
(A) පෞච්ඡ වරලේ ඉහළ ඛණ්ඩිකාව පහළ ඛණ්ඩිකාවට වඩා විශාලය.
(B) සියල්ලන් ම ජලජවාසීන් වන අතර ජලක්ලෝම පිධානයකින් වැසී ඇත.
(C) පැතලි චක්‍රාකාර කොරල වලින් දේහය ආවරණය වී ඇත.
(D) සමහරු අණ්ඩ ජලාබුජ වන අතර බාහිර සංසේචනය සිදුකරයි.
(E) ජම්බාලිය තනි විවරයක් සහිත කුටීරයකි (1996 - Z)

(49) පහත සඳහන් ඒවා අතරින් කරදිය හා මිරිදිය වාසී ආකාර පමණක් අඩංගු වන සත්ත්ව කාණ්ඩය වනුයේ,

1. සිලෙන්ටෙරාවන් ය 2. ඇනලිඩාවන් ය 3. එකිනොඩර්මියාවන් ය
4. මොලුස්කාවන් ය 5. ක්‍රස්ටේසියාවන් ය (1997 - Z)

(50) පහත සඳහන් ඒවා අතරින් කෝඩාටාවන්ට පමණක් සීමා වූ ලක්ෂණයක් නොවනුයේ කුමක්ද?

1. පෘෂ්ඨරජ්ජුව 2. අපර ගුද වලිගය 3. ග්‍රසනික පැලුම්
4. සංවෘත රුධිර සංසරණ පද්ධතිය 5. උදරීය හෘදය (1997 - Z)

(51) ආවේස් වර්ගය පිළිබඳව සත්‍ය නොවනුයේ පහත සඳහන් ඒවායින් කුමක්ද?

1. වා කුටීර සහිත පියාපත් 2. කවචමය බිත්තර තිබීම
3. දත් නොතිබීම 4. කෙරටිනීභවනය වූ පිහාටු ඇත
5. වාත කෝෂ තිබීම (1997 - Z)

(52) උරගයින්ට සහ පක්ෂීන්ට පොදු ලක්ෂණයක් නොවනුයේ,

1. ගාත්‍රා යුගල් දෙක ය 2. අචලතාපී බව
3. අභ්‍යන්තර සංසේචනය 4. අපිචර්මීය කොරලය
5. ද්විත්ව සංසරණය පෙන්වීම (1998 -Z)

(53) පහත සඳහන් ඒවා අතරින් එක් වංශයකට පමණක් සීමා වූ ලක්ෂණයක් නොවනුයේ කුමක්ද

1. දංශක කෝෂ්ඨ 2. පෙඩිසෙලේරියා 3. වෘක්කිකා
4. රේත්‍රිකාව 5. ඇහිතලය (1998 - Z)

(54) පහත සඳහන් එක් ප්‍රතිචාරයක දක්වා ඇති ප්‍රධාන බහිස්‍රාවී ඵලය එය ඉදිරිපිට දී ඇති සත්ත්ව කාණ්ඩයට අදාළ නොවේ. මෙම ප්‍රතිචාරය තෝරන්න.

<u>සත්ත්ව කාණ්ඩය</u>	<u>ප්‍රධාන බහිස්‍රාවී ඵලය</u>
1. සිලෙන්ටෙරාටාවන්	ඇමෝනියා
2. උභයජීවී කීටයින්	ඇමෝනියා
3. උරගයින්	යූරියා
4. ක්ෂීරපායීන්	යූරියා
5. පක්ෂීන්	යූරික් අම්ලය

(1998 - Z)

(55) Osteichthyes වර්ගයේ ජීවීන් සතු ලක්ෂණයක්/ලක්ෂණ වන්නේ,

(A) කශේරුව පෞච්ඡ වරලේ ඉහළ ඛණ්ඩිකාවට විහිදී නැත.
(B) බොහෝමයක් අභ්‍යන්තර සංසේචනය පෙන්වන අතර ඇතැමුන් බාහිර සංසේචනය පෙන්වයි.
(C) බොහෝ විශේෂ අණ්ඩජ වන අතර අස්ථිමය සැකිල්ලක් ඇත.
(D) උදරීය මුඛයක් නැත.
(E) රළු කොරළ වලින් ආවරණය වූ දේහ දරයි. (1998 - Z)

(56) Amphibia වර්ගයේ ජීවීන් සතු ලක්ෂණයක්/ලක්ෂණ වන්නේ,

(A) ජලය හා ගොඩබිම යන පරිසර දෙකෙහිම වාසය කරන අතර ගොඩබිම ආක්‍රමණය කළ ප්‍රථම කෝඩේටාවන් ය.
(B) ප්‍රථම වතාවට ගාත්‍රා දරන සතුන් වුවද සමහරුන්ට ගාත්‍රා නැත.
(C) බොහොමයක් අභ්‍යන්තර සංසේචනය සිදුකරමින් කවච රහිත බිත්තර දමයි.
(D) චලතාපී බැවින් පරිවෘත්තීය සීමා වේ.
(E) දේහය සතු සෑම DNA අණුවක්ම හිස්ටෝන ප්‍රෝටීන සමඟ බැඳී පවතී. (1998 - Z)

(57) පක්ෂීහු,

1. ඔවුන් දේහ උෂ්ණත්වය යාමනය කරති.
2. අපරකපාල සන්ධාර අග්‍ර දෙකක් සහිත හිස් කබල් දරති.
3. ප්‍රධාන නයිට්‍රජනීය අපද්‍රව්‍ය ලෙස යූරියා බහිස්‍රාවය කරයි.
4. ක්‍රියාකාරී ඩිම්බකෝෂ දෙකක් දරති.
5. කොරපොතු නොදරති. (1999 - Z)

(58) සෑම ඇනෙලිඩාවකුට ම,

1. දෘඩි කෙඳි ඇත. 2. අංශපාදිකා ඇත. 3. මෙවුලක් ඇත.
4. පැහැදිලි හිසක් ඇත. 5. වෘක්කිකා ඇත. (1999 - Z)

(59) පහත සඳහන් ලක්ෂන අතරින් කොන්ඩ්‍රික්තියේස් වර්ගයේ සාමාජිකයින් අතර පමණක් දක්නට ලැබෙනුයේ කුමක්ද?

1. රළු කොරල 2. විෂමාංග පුච්ඡ පෞච්ඡ වරල
3. මධ්‍යවෘක්ක 4. කපාල ස්නායු යුගල් දහයක්
5. ග්‍රසනික ජලක්ලෝම (1999 - Z)

(60) පහත සඳහන් ඒවා අතරින් ආත්‍රොපෝඩා වංශයේ ආවේණික ලක්ෂණයක් නොවනුයේ කුමක්ද?

1. උදරීය ස්නායු රජ්ජු යුගලයක් 2. විවෘත සංසරණය
3. සම්පූර්ණ ජීර්ණ පද්ධතිය 4. අන්වායාම පේශි
5. කයිටිනීය පිටසැකිල්ල (1999 - Z)

(61) ආත්‍රොපෝඩාවන්ගේ ශ්වසනයට සම්බන්ධ නොවනුයේ,

1. ජලක්ලෝම ය. 2. නාල පාද ය 3. ශ්වාසනාල ය.
4. දේහ පෘෂ්ඨය ය. 5. පත් පෙණහැලි ය. (1999 - Z)

(62) Reptilia වර්ගයේ ජීවීන් සතු ලක්ෂණයක් වන්නේ,

1. ගොඩබිමදී ජල සංරක්ෂණයට කයිටිනීමය උච්චර්මයකින් වැසුණු දේහයක් ඇත.
2. වායුගෝලයෙන් ශ්වසනය කිරීමට පත් පෙනහැලි පිහිටයි.
3. පළමු වරට කලල පටල සහිත කෙරටිනීමය කවච වලින් ආවරිත බිත්තර දමයි.
4. බාහිර සංසේචනය සිදුකරන අතර සම්පූර්ණ භෞමික ජීවිතයකට අනුවර්තනය වී ඇත.
5. සියල්ලෝම චලතාපීන් වන අතර අණ්ඩජ වේ. (1999 - Z)

(63) Aves වර්ගයේ ජීවීන් සතු ලක්ෂණයක් වන්නේ,
1. සැහැල්ලු දේහය, අධික පරිවෘත්තීය සීඝ්‍රතාවය, කුහර සහිත පේශි පියාසර කිරීමට අනුවර්තනය වේ.
2. ඇතැම් අයට සංවෘත හා ඇතැම් අයට විවෘත රුධිර සංසරණ පද්ධති ඇත.
3. කියුටිනීමය පිහාටු වලින් දේහය ආවරණය වී ඇත.
4. කවච සහිත බිත්තර දමන අතර බාහිර සංසේචනය සිදුකරයි.
5. පක්ෂීන්ට වර්ණ දෘෂ්ටිය ඇත. (1999 - Z)

(64) පහත සඳහන් ඒවා අතරින් එක් වංශයකට පමණක් සීමා වූ ලක්ෂණයක් වනුයේ කුමක්ද?
1. අභ්‍යන්තර සැකිල්ල 2. බිහිතලනය කළ හැකි ග්‍රසනිකාව
3. බාහිර කවචය 4. කොරල
5. මස්තිෂ්ක ගැංග්ලියම් (2000 - Z)

(65) මොලුස්කා වංශයට පමණක් සීමා වූ ලක්ෂණයක් වනුයේ,
1. ත්‍රි ප්‍රස්තරතාවය ය 2. ට්‍රොකොපෝර් කීටයා
3. විවෘත රුධිර සංසරණ පද්ධතිය 4. ප්‍රාවරණය
5. මස්තිෂ්ක ගැංග්ලියම් (2000 - Z)

(66) පහත සඳහන් ඒවා අතරින් කෝඩාටා වංශයේ ආවේණික ලක්ෂණයක් නොවන්නේ කුමක්ද?
1. පශ්ච ගුද වලිගය 2. උදරීය හෘදය 3. කශේරුව
4. ග්‍රසනික ජලක්ලෝම පැලුම් 5. සීලෝමය (2000 - Z)

(67) Mammalia වර්ගයේ ලාක්ෂණික ගති ලක්ෂණයක්/ලක්ෂණ වන්නේ,
(A) බාහිර කන්පෙති හා රෝම දැරීම ආවේණික ලක්ෂණ වේ.
(B) පෘෂ්ඨ රජ්ජුව උදරීයව කුහරමය තනි ස්නායු රජ්ජුවක් ඇත.
(C) ළපැටියෝ ස්තන ග්‍රන්ථි වලින් නිපදවෙන කිරිමත යැපෙති.
(D) සාමාජිකයෝ සියල්ල ඉහළ පරිවෘත්තීය සීඝ්‍රතා දක්වති.
(E) චලතාපී වන අතර ළපැටියෝ දීර්ඝ කාලයක් මව්පිය ආරක්ෂාව යටතේ වර්ධනය වේ. (2000 - Z)

(68) Annelida හා Mollusca යන වංශ එකිනෙකින් වෙන්කර හඳුනාගත හැකි ලක්ෂණයක්/ලක්ෂණ වන්නේ,
1. කැල්සිභවනය වූ ව්‍යුහ දැරීම
2. කරදියෙහි වාසය කරන ජීවීන් සිටීම
3. භ්‍යන්තර සංසේචනය පෙන්වීම
4. අලිංගික ප්‍රජනනය දැරීම
5. කයිටිනීමය ව්‍යුහ දැරීම (2000 - Z)

(69) පහත ලක්ෂණ අතරින් Nematoda වංශයට පමණක් ආවේණික ලක්ෂණයක් වන්නේ,
1. වැඩි දෙනෙක් කරදියවාසීන් ය.
2. ශීර්ෂණයක් හෝ ඛණ්ඩිකාවක් නොපෙන්වීම.
3. දේහ බිත්තිය හරහා සරල විසරණයෙන් වායු හුවමාරුව සිදුකිරීම.
4. ත්‍රිප්‍රස්තරික ව්‍යාජ සීලෝමිකයන් වීම.
5. දේහ බිත්තියේ අන්වායාම පේශි දැරීම. (2000 - Z)

(70) Annelida වංශයේ මුල් වරට දක්නට ලැබෙන ලක්ෂණයක් නොවන්නේ,
1. ශීර්ෂණය 2. ඛණ්ඩනය 3. සීලෝමය
4. බහිස්ස්‍රාවී අවයව 5. රුධිර සංසරණ පද්ධතිය (2000 - Z)

(71) පෘෂ්ඨවංශීන්ගේ ඇස් වලට බොහෝ දුරට සමාන ඇස් ඇත්තේ පහත දැක්වෙන කුමන සත්ත්ව කාණ්ඩයටද?
1. ඇනලිඩාවන් 2. ආත්‍රොපෝඩාවන් 3. මොලස්කාවන්
4. ප්ලැටිහෙල්මින්තයන් 5. එකයිනොඩර්මේටවන් (2000)

(72) ක්ෂේත්‍ර අධ්‍යයනයකදී ශිෂ්‍යයෙක් මිරිදිය පොකුණක් තුළ කොරල රහිත සිනිඳු සමක් සහ යුගලමය ගාත්‍රා සහිත සතෙකු නිරීක්ෂණය කලේය. මෙම සත්ත්වයා අයත්වීමට බොහෝ දුර ඉඩ ඇත්තේ,
1. Osteichthyes වර්ගයටය 2. Chondrichthyes වර්ගයටය
3. Amphibia වර්ගයටය 4. Reptilia වර්ගයටය
5. Mammalia වර්ගයටය (2000)

(73) නෙමටෝඩාවෙක් ඇනලිඩාවෙකුගෙන් පහසුවෙන් වෙන් කර හඳුනාගත හැක්කේ,
1. සිලින්ඩරාකාර හැඩය නිසාය 2. ඛණ්ඩ රහිත දේහය නිසාය
3. චූෂකර නොතිබීම නිසාය 4. බාහිර ජලක්ලෝම නොතිබීම නිසාය
5. උපාංග නොතිබීම නිසාය (2000)

(74) Chordata වංශයට පරිණාමිකව වඩාත්ම බන්ධුතා දක්වන අපෘෂ්ඨවංශී වංශය වනුයේ,
1. Arthropoda ය 2. Annelida ය 3. Echinodermata ය
4. Mollusca ය 5. Platyhelminthesය (2000)

(75) පහත ලක්ෂණ දරන සත්ව වංශය වන්නේ,
a) ශීර්ෂණය පිළිබඳ සලකුණු ඇති නමුත් පැහැදිලි නැත.
b) දේහ කුහර, පරිවහන, ශ්වසන හා කංකාල පද්ධති නැත.
c) නිදලිවාසීන්ට සංචරණය සඳහා ආධාර වන පක්ෂ්ම ඇත.
1. Cnidria 2. Platyhelminthes 3. Nematoda
4. Annelida 5. Arthropoda (2001)

(76) පහත සඳහන් කුමන තක්සෝනයේ / තක්සෝන වල කරදිය ජීවීන් අන්තර්ගත වේද?
(A) Chlorophyta (B) Bryophyta (C) Chondrichthyes
(D) Reptilia (E) Lycophyta (2002)

(77) පහත දැක්වෙන වංශය/ලක්ෂණය සංකලනයන් අතරින් වැරදි වන්නේ කුමක්ද?

වංශය	ලක්ෂණය
1. Pterophyta	සොරස දැරීම
2. Byrophyta	මුල් දැරීම
3. Cycadophyta	මහා බීජාණු පත්‍ර දැරීම
4. Mollusca	උදරීය පාදයක් දැරීම
5. Echinodemata	අන්තඃසැකිල්ලක් දැරීම

(2002)

(78) ජීවීන් සංඛ්‍යාව මත වැඩිම වංශය වනුයේ.
1. Cnidria 2. Platyhelminthes 3. Nematoda
4. Annelida 5. Arthropoda

(79) Chondrichtyes වර්ගයට අයත් සත්තු,
(A) රළු කොරල දරති (B) පිධානයක් නොදරති
(C) සමාන බණ්ඩිකා දෙකක් සහිත වලිග වරල් දරති
(D) අස්ථි වලින් සැකසුනු සැකිලි දරති
(E) මිරිදිය වාසස්ථාන හා කරදිය වාසස්ථාන යන දෙකෙහිම ජීවත් වෙති (2003)

(80) පරිණාමයේදී ප්‍රකාශ ප්‍රතිග්‍රාහක විකසනය වූ ප්‍රථම සත්ත්ව කාණ්ඩය වන්නේ,
1. සීලන්ටරේටාවන් ය 2. පැතලි පණුවන් ය 3. ඇනලිඩාවන් ය
4. ආත්‍රොපොඩාවන් ය 5. මොලස්කාවන් ය (2003)

(81) ශ්‍රී ලංකාවේ මිරිදිය පොකුණු වල දක්නට නොලැබෙන්නේ පහත සඳහන් කුමන වර්ගීකරණ කාණ්ඩයට අයත් ජීවීන්ද?
1. සයනොබැක්ටීරියා 2. නිඩාරියා 3. එකයිනොඩර්මේටා
4. ක්ලොරොෆයිටා 5. මොලුස්කා (2005)

(82) පහත සඳහන් ප්‍රකාශ අතරින් එකයිනොඩර්මේටා වංශය පිළිබඳ නිවැරදි වන්නේ කුමන ප්‍රකාශය ද/ප්‍රකාශ ද?
(A) ඔවුහු නාල පාද මගින් සංචරණය කරති.
(B) ඔවුහු පෙඩිසලේරියා දරති
(C) ඔවුන්ගෙන් සමහරකේ දිගු බාහු දරති.
(D) ඔවුන්ගෙන් සමහරක් පැතලි මඬලාකාර දේහ දරති
(E) ඔවුනගෙන් සමහරෙකුට ගුදයක් නොමැත. (2007)

(83) කයිටිනීමය ව්‍යුහ දරන සත්ව වංශ යුගලය සතු වෙනත් ලක්ෂණයක් වන්නේ,
1. අසීලෝමික වීම.
2. සියලුම ජීවීන් ද්විපාර්ශ්වික සමමිතික වීම.
3. විවෘත රුධිර සංසරණ පද්ධති දැරීම.
4. ජලක්ලෝම දරන ජලජ ජීවීන් සිටීම.
5. බණ්ඩනය වූ සිලින්ඩරාකාර දේහ දැරීම. (2007)

(84) අභ්‍යන්තර සංසේචනය පෙන්වන ජීවීන් අඩංගු සත්ව වර්ගය/වර්ග වන්නේ,
1. Chondrichthyes 2. Osteichthyes 3. Amphibia
4. Reptilia 5. ඉහත සියල්ලම (2008)

(85) Aves වර්ගය සතු පියැසරිය සඳහා වන අනුවර්තනයක් නොවන්නේ,
1. සැහැල්ලු ශරීරය 2. වාත කුටීර සහිත අස්ථි
3. පහළ පරිවෘත්තීය සීඝ්‍රතාවය 4. ශරීර ප්‍රමාණය කුඩා වීම
5. පියාපත් දැරීම (2008)

(86) පහත ලක්ෂණ දරණ ජීවීන් අඩංගු සත්ව වංශයේ ජීවීන් පෙන්වන වෙනත් ලක්ෂණයක් වන්නේ,
a) සියල්ලොම කරදියවාසීන් ය.
b) අන්තඃ සැකිල්ල තුනී අපිචර්මයකින් ආවරණය කරයි.
1. සංසරණ පද්ධතිය විවෘත, හෘදයක් රහිත ක්ෂීණ වූ එකක් වීම.
2. පත් පෙනහලු ශ්වසනය සඳහා දායක වීම.
3. සාමාන්‍යයෙන් සම්පූර්ණ ආහාර ජීර්ණ පද්ධතියක් දැරීම.
4. ශීර්ෂණය හා බණ්ඩනය දැරීම.
5. හොඳින් වර්ධනය වූ ස්නායු පද්ධතියක් නැත. (2009)

(87) වැසි දිනයකදී තම ගෙවත්තේ ජලජ පරිසරයක පෘෂ්ඨෝදරීය ව පැතලි මෘදු දේහයක් සහිත සත්ත්වයෙක් ශිෂ්‍යයෙකු විසින් නිරීක්ෂණය කරන ලදී. මෙම සත්ත්වයාගේ නොතිබීමට ඉඩ ඇත්තේ පහත සඳහන් ඒවායින් කුමක්ද?
1. වෘත්තාකාර පේශි 2. පක්ෂ්ම 3. ගුදය
4. අන්වායාම ස්නායු රජ්ජු 5. බහිස්‍රාවී ප්‍රණාල (2010)

(88) පහත ලක්ෂණ අතරින් කවරක් අනෙලිඩා හා එකයිනොඩර්මේටා යන කාණ්ඩ දෙකෙහිම දක්නට ලැබේද?
(A) හොඳින් විකසනය වූ සීලෝමය (B) වෘක්කිකා (C) බාහිර සංසේචනය
(D) ජලක්ලෝම (E) කීට අවස්ථා (F) ශීර්ෂණය
1. B, D හා E පමණි 2. A, C හා D පමණි 3. A, C, D හා E පමණි
4. A, C, D හා F පමණි 5. A හා E පමණි (2011)

(89) පහත ව්‍යුහ අතරින් ජීවීන්ගේ ශ්වසනය සඳහා දායක වන ව්‍යුහය/ව්‍යුහ වන්නේ,
(A) ජලක්ලෝම (B) මැල්පිගීය නාලිකා (C) පත් පෙනහැලි
(D) පෙනහැලි (E) සිළු බල්බ (2012)

(90) බහිස්‍රාවී හා ශ්වසන ව්‍යුහ මුලින්ම හමුවන සත්ව වංශ වන්නේ,
1. Nematoda හා Annelida 2. Platyhelminthes හා Nematoda
3. Platyhelminthes හා Annelida 4. Annelida හා Mollusca
5. Annelida හා Arthropoda (2012)

(91) පහත සත්ත්ව වංශය හා ඊට අදාළ ලක්ෂණ නිවැරදිව ගලපා ඇත්තේ,

අ	ආ
Annelida	A. සිළු බල්බ තිබීම
Arthropoda	B. ඩියුටෙරොස්ටෝමිකයන් වීම
Platyhelminthes	C. සන්ධි පාද දැරීම
Echinodermata	D. අංශපාදිකා ඇරීම

1. ACDB 2. DCBA 3. DCAB
4. BACD 5. CDAB (2013)

(92) Annelida වංශයේ බාහිර පරපෝෂී ආකාර වල සංචරණයට හා අධිග්‍රහණයට අධාර වන්නේ,
1. වෘක්කිකා 2. දෘඩිකෙඳි 3. මෙවුල 4. අංශ පාදිකා
5. චූෂකර (2013)

(93) චූෂකර දරන සතුන් අන්තර්ගත නොවන්නේ පහත සඳහන් කුමන වංශයේද?
1. ප්ලැටිහෙල්මින්තේස් 2. ඇනලිඩා 3. නෙමටෝඩා
4. මොලස්කා 5. එකයිනොඩර්මේටා (2014)

(94) මොලොස්කාවන් කිහිපදෙනෙකු, ඔවුන් දරන ව්‍යුහ කිහිපයක් සහ ඔවුන ජීවත්වන පරිසර පහත වගුවේ දක්වේ.

මොලස්කාවන්	ව්‍යුහ	පරිසර
A - මට්ටියා	a - ඇස්	i - කරදිය
B - ගොලුබෙල්ලා	b - ග්‍රාහිකා	ii - මිරිදිය
C - කාවාටියා	c - රේත්‍රිකාව	iii - භෞමික
D - දැල්ලා	d - බාහිර කවචය	

පහත දක්වෙන මොලස්කාවා - ව්‍යුහය - පරිසරය සංකලන අතුරින් නිවැරදි වන්නේ කුමන සංකලනයද?
1. C a i 2. B b iii 3. A c ii 4. D d i 5. C b i (2014)

(95) අභ්‍යන්තර සංසේචනය නොදක්වන සතෙකු/සතුන් ඇතුළත් වන්නේ පහත සඳහන් කුමන කාණ්ඩයේද?
1. Planaria, සමනලයා, ගොලුබෙල්ලා
2. මෝරා, Bipalium, ගෙමැස්සා
3. කැරපොත්තා, ගල්මාළුවා, අක්මා පැතැල්ලා
4. Ichthyophis, පටිපණුවා, මදුරුවා
5. ගිරවා, කුරා, මඩුවා (2014)

(96) Cnidaria වංශයට පමණක් ආවේණික ලක්ෂණයක් වන්නේ,
1. බොහෝ ජීවීන් කරදියේ වාසය කිරීම.
2. ආමාශවාහිනී කුහරයක් දැරීම.
3. ඇතැම් ජීවීන් නිදැලිවාසීන් වීම.
4. දංශක කෝෂ්ඨ දරන ග්‍රාහිකා තිබීම.
5. සිළු බල්බ සහිත බහිස්‍රාවී පද්ධතියක් තිබීම (2014)

(97) චලතාපී අණ්ඩජ සහ කෙරටිනීමය ශල්ක දරන සත්ත්ව කාණ්ඩය වනුයේ පහත සඳහන් ඒවායින් කුමක්ද?
1. කොන්ඩ්‍රික්තියේස් 2. ඔස්ටෙයික්තියේස් 3. ඇම්ෆිබියා
4. රෙප්ටීලියා 5. ආවේස් (2015)

(98) කරදියේ වෙසෙන ජීවීන් අයත් සත්ව වංශය / වංශ වන්නේ,
(A) Cnidaria (B) Nematoda (C) Annelida
(D) Mollusca (E) Arthropoda (2015)

(99) බාහිර සංසේචනය පෙන්වන කෝඩේටා වංශයේ වර්ගය/වර්ග වනුයේ,
(A) Chondrichthyes (B) Reptilia (C) Osteichthyes
(D) Amphibia (E) Aves (2015)

(100) කෝඩේටාවන් සහ මොලස්කාවන් යන කාණ්ඩ දෙකෙහිම දක්නට ලැබෙන්නේ පහත සඳහන් කුමන ලක්ෂණය ද? / ලක්ෂණ ද?
(A) ඇතුළු සැකිල්ල (B) ජලක්ලෝම (C) අභ්‍යන්තර සංසේචනය
(D) හොඳින් විකසනය වූ ඇස් (E) රේත්‍රිකාව (2016)

(101) ගෝනුස්සා, හැකරැල්ලා, කැරපොත්තා, ඉස්සා සහ පත්තෑයා එකිනෙකාගෙන් වෙන්කර ගැනීම සඳහා ප්‍රායෝගික පන්තියේදී දෙබෙදුම සුචියක් සෑදීමේදී අවම වශයෙන් ප්‍රයෝජනවත් විය හැක්කේ පහත සඳහන් ඒවායින් කුමක්ද?
1. පිටසැකිල්ල 2. ස්පර්ශක 3. ඇස් 4. පියාපත් 5. පාද (2017)

(102) ග්‍රාහිකා දරන, උදරීය හෘදයක් නොදරන, ද්විපාර්ශ්වික සමමිතික සීලෝමික සතෙකුට තිබිය හැක්කේ පහත සඳහන් ඒවායින් කුමක්ද?
1. කණ්ටක 2. ස්නායු වලය 3. ස්පර්ශක
4. ජලක්ලෝම 5. අනුපක්ෂක (2018)

(103) ප්‍රධාන බහිස්‍රාවී ද්‍රව්‍යය යූරියා වන ජලජ සහ භෞමික වාසී චලතාපී සතෙකු පහත සඳහන් කුමන ව්‍යුහය/ව්‍යුහ දැරිය හැකිද?
(A) ජලක්ලෝම (B) කුටීර හතරක් සහිත හෘදය (C) ගෙල
(D) පෙනහැලි (E) හොට (2018)

(104) අභ්‍යන්තර සංසේචනය දක්වන සතුන් මෙන් ම බාහිර සංසේචනය දක්වන සතුන් ද අන්තර්ගත වන්නේ පහත සඳහන් කුමන වර්ගයේ ද? / වර්ගවල ද?

(A) ඔස්ටික්තියේස් (B) ඇම්ෆිබියා (C) රෙප්ටිලියා
(D) කොන්ඩ්‍රික්තියේස් (E) ආවේස් (2019)

(105) ජීවීන්ගේ පරිණාමයේ දී සීලෝමය ප්‍රථමයෙන් ම විකසනය වූයේ,

1. ඇනලීඩාවන්ගේ ය.
2. ආත්‍රොපෝඩාවන්ගේ ය.
3. මොලස්කාවන්ගේ ය.
4. එකයිනොඩර්මේටාවන්ගේ ය. (2019)
5. කෝඩේටාවන්ගේ ය.

(106) ඇනලීඩාවන්ගේ මෙන් ම ආත්‍රොපෝඩාවන්ගේ ද දැකිය හැක්කේ පහත සඳහන් කුමන ව්‍යුහය ද?

1. මෙවුල
2. අංශපාදිකා
3. උදරීය ස්නායු රජ්ජුව
4. කේශනාලිකා
5. කයිටිනීය පිටසැකිල්ල (2019)